# මහ රහතුන් වැඩි මඟ ඔස්සේ




## ආර්ය අෂ්ටාංගික මාර්ගය



ඉදිරිපත් කිරීම: දීපිකා බමුණුආරච්චි

## මේ සටහන් තැබූ භික්ෂූන්වහන්සේගේ පුණ්‍යානුමෝදනාව

මාගේ ගුරුදේවයාණන් වහන්සේ වන
අති ගෞරවණීය දොඩම්පහල චන්ද්‍රසිරි
මහනායක ස්වාමීන්වහන්සේට ද
කල්‍යාණමිත්‍රභාවයෙන් උපකාර කළා වූ
සියළුම ගෞරවණීය ස්වාමීන්වහන්සේලාට ද
නිදුක් නිරෝගී සුවපත්භාවය පිණිසත්
මේ ජීවිතයේ දීම
චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධය පිණිසත්
මෙම ධර්මදානමය කුසලය හේතු වේවා...

ධර්ම දානය පිණිස නොමිලේ බෙදා හැරෙන සදහම් තිළිණයකි...

# මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

# ආර්ය අෂ්ටාංගික මාර්ගය

අතිපූජ්‍ය රාජගිරියේ අරියඥාණ ස්වාමීන්වහන්සේ විසින්
කරන ලද ධර්ම සාකච්ඡාවක් ඇසුරින්
උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගය
පින්වත් ඔබ සැමගේ ධර්මාවබෝධය
උදෙසා පිළිගන්වමි.


ඉදිරිපත් කිරීම

**දීපිකා බමුණුආරච්චි**

# ධර්ම දානය පිණිසයි.....

© දීපිකා බමුණුආරච්චි

ප්‍රථම මුද්‍රණයඃ 2015 - පෙබරවාරි
දහවන මුද්‍රණයඃ 2015 - නොවැම්බර්
විසිවන මුද්‍රණය - 2016 ජූනි
විසිපස්වන මුද්‍රණය - 2017 පෙබරවාරි
විසිහයවන මුද්‍රණය - 2017 මාර්තු
විසිහත්වන මුද්‍රණය - 2017 මැයි

ISBN 978-955-7887-07-4

**වෙබ් පිටුවඃ**

**www.maharahathunwedimagaosse.com**
**www.mrwo.lk**

**තැපැල් මගින් ලබා ගැනීමට අවශ්‍යනම්,**

අගල් 6.5 x 9.5 හෝ ඊට වැඩි ප්‍රමාණයේ ලියුම් කවරයක තමාගේ නම හා ලිපිනය ලියා රු. 90 ක මුද්දර අලවා එය පහත ලිපිනයට යොමු කරන්න.
ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්, 444/3B, පිටිපන දකුණ, හෝමාගම

**ධර්ම දානයන් සඳහා නිෂ්පාදන වියදමට මෙම දහම් පොත් ලබා ගැනීම සඳහා විමසන්න.**

දුරකථනඃ 0712199900
0112755768 (සතියේ දිනයන්හිදී පෙ.ව. 9.30 සිට ප.ව. 4.00 දක්වා),

**කවරයේ ඡායාරූපය**

ශ්‍රී කල්‍යාණිවංශ නිකායේ මහා නායක, අමරපුර සංඝ සභාවේ ගරු සභාපති ගෞරවණීය දොඩම්පහල චන්ද්‍රසිරි මහා නායක හිමිපාණන්ගේ ඉල්ලීම පරිදි, වසන්ත බමුණුආරච්චි මහතා සහ දීපිකා බමුණුආරච්චි මහත්මියගේ පූර්ණ ධන පරිත්‍යාගයෙන්
ඉදිකල දොඩන්දූව ශෛලබිම්බ මහා විහාරස්ථ නදී සීමාමාලකය.

**මුද්‍රණය හා බෙදාහැරීම**

ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්
444/3B, පිටිපන දකුණ, හෝමාගම

මේ ඝෝර කටුක භයානක සංසාරයේ
සියදුක, මේ ආත්මභාවයේදීම
සසර දුකින් එතෙර වීමට
අධිෂ්ඨානය කරන්න. වීර්ය වඩන්න
මරණය ඔබ ළඟ ඇත්තේ "දැන්ම"
හිස ඇවිදි ඉතුරුම වමනාත්
සේ අනිත්‍ය ස්වභාවය
ඉවසාකාරයෙක් වේවා, සෙත්වියෙකුම වේවා
ගර්භයෙකුම වේවා
තම තමාම එළඹෙන මරණයට
තම තමන්ගේ ජීවිත වලින් අ-රක්ෂා ගන්නේවා.
දුරටු හෝ විපාකෝපය වරද් අතරේ
ඔබ කොතැන වරදක
ඔබ නොගැනේවා.
පුනරුත්ථාන අනුකම්පා කෙරේවා
වරද් නැතහොත් නිවැරදි වෙය
නිවැරදි මොක දකින්න.
වෙළඳ සටහන් නැව් අවිච්ඡේදලා
ඔබ සැබෑම සතුටුක වේවා.
තව නැවතම වැටීම නොව ගන්නේවා.

(පින්වත් ඔබ වෙනුවෙන් මෙම සටහන් තැබූ භික්ෂුන් වහන්සේ විසින් ලියුවකි.)

## ස්වාමීන් වහන්ස ගිහි පින්වතුන්වන අපි මේ ධර්ම මාර්ගයට අවතීර්ණ වන්නේ කෙසේද?

ධර්ම මාර්ගය කියලා කියන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයට. සාරා සංඛ්‍ය කල්ප ලක්ෂ ගණනාවක් බෝධිසත්වවරයෙක් දස පාරමී ධර්ම පූර්ණ කරලා, උතුම් සම්මා සම්බුද්ධත්වයට පත්වෙන්නේ, මේ උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගය ලෝකයාට මතුකොට දෙන්න. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය සීල, සමාධි, ප්‍රඥා කියලා කොටස් තුනකට බෙදෙනවා. සීලයට අදාළව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව කියන කාරණා තුන. සමාධියට අදාළව සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි කියන කාරණා තුන. ප්‍රඥාවට අදාළව සම්මා දිට්ඨි සහ සම්මා සංකප්ප දේශනා කරනවා. මේ කාරණා අටේ එකතුවයි ආර්ය අෂ්ටාංගික මාර්ගය කියන්නේ. ධර්ම මාර්ගයේ ගමන් කරන පින්වතා, පින්වතිය අනිවාර්යයෙන්ම මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයට බැස ගත යුතුයි. බුදුරජාණන් වහන්සේ ආර්ය අෂ්ටාංගික මාර්ගය දේශනා කොට තිබෙන්නේ අනුපිළිවෙලකට. එක මාර්ග අංගයක් වැඩීමේ හේතුවෙන් සකස්වෙන ඵලයක් වශයෙන් තමයි දෙවැනි මාර්ග අංගය වැඩෙන්නේ. උදාහරණයක් කියනවා නම් සම්මා දිට්ඨිය වැඩුවොත් තමයි, සම්මා සංකප්පය වැඩෙන්නේ, සම්මා සංකප්පය වැඩුවොත් තමයි, සම්මා වාචාව වැඩෙන්නේ. හේතුඵල ධර්මයන් මත දේශනා කළ ධර්මයක්.

මේ උතුම් ධර්ම මාර්ගයට අවතීර්ණ වන පින්වතා, අනිවාර්යයෙන්ම සම්මා දිට්ඨිය කියන දොරටුවෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගයට ඇතුල් විය යුතුයි. සම්මා දිට්ඨිය නැමැති ප්‍රධාන දොරටුවෙන් බැහැරව, කෙටි මාර්ග, පහසු මාර්ග, සැප මාර්ග ඔස්සේ අතුරු දොරටුවලින් ආර්ය අෂ්ටාංගික මාර්ගයට අවතීර්ණ වුණොත් අනිවාර්යයෙන්ම ඔබ තුල වැඩෙන්නේ මිච්ඡා ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. පින්වත් ඔබට ඉහත කාරණය පැහැදිලි කොට දෙන්න උදාහරණයක්

කියන්නම්. දවසක් මහත්මයෙක් භික්ෂුව මුණගැසෙන්න කුටියට පැමිණියා. ඒ මහත්මයා කියන විදියට එම මහත්මයා ජීවිතයෙන් වැඩි කාලයක් යොමු කරන්නේ භාවනාවට. ඒ මහත්මයා භාවනාවේ දියුණුව ගැන භික්ෂුවට කියමින් සිටියදී, භික්ෂුව වැඩ සිටින ප්‍රදේශයේ නිතර සැරිසරන වඳුරු රංචුව ගස් වල අතු සොලවමින් කුටිය සමීපයට පැමිණියා. ඒ වෙලාවේ එම භාවනා කරන මහත්මයා කියනවා, වඳුරෝ කියන්නේ අපේ මුතුන් මිත්තෝ කියලා. එතකොට භික්ෂුව එම මහත්මයාගෙන් ඇසුවා, වඳුරෝ කොහොමද අපේ මුතුන් මිත්තෝ වෙන්නේ කියලා. එතකොට එම භාවනා කරන මහත්මයා කියනවා අපි පැවතෙන්නේ වානරයාගෙන්ය කියලා. භික්ෂුව ඒ මහත්මයාගෙන් ඇසුවා, ලෝකය හට ගැනීමට අදාළව බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ අග්ගඤ්ඤ සූත්‍රය මහත්මයා කියවලා නැතිද කියලා. ඒ වෙලාවේ ඒ මහත්මයා කියනවා අදාළ සූත්‍රය කියවලා තිබෙනවා, නමුත් එම සූත්‍රයේ ඇති කරුණු තමා පිළිගන්නේ නැහැය කියලා. බලන්න බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ ධර්මයක් පිළිගන්න සූදානම් නැහැ. නමුත් ජීවිතයේ ප්‍රධානම කාර්යය භාවනාව. සම්මා දිට්ඨියෙන් තොරව සම්මා සතියක්, සම්මා සමාධියක් සොයනවා. සමහර විද්‍යා අංශයෙන් අධ්‍යාපනය ලබන පින්වතුන්ලා සිටිනවා. එම පින්වතුන් ඕපපාතිකව සත්ත්වයන් උපදිනවාය කියලා විශ්වාසයක් නැහැ. මේ දැක්ම හරි අනතුරුදායකයි. සම්මා දිට්ඨිය නැමැති දොරටුවෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගයට ඇතුල් නොවීමේ විපාකයයි ඔබ මේ දකින්නේ. වර්තමාන සමාජය තුළ භාවනාවේ නාමයෙන් සම්මා දිට්ඨියේ ප්‍රධාන දොරටුවෙන් බැහැරව සම්මා සතියත්, සම්මා සමාධියත් සෙවීමේ නිරර්ථක ව්‍යායාමයක හැඩරුව පෙනෙන්ට තිබෙනවා.

**ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ සඳහන් කළා ආර්ය අෂ්ටාංගික මාර්ගයට පිවිසීමේදී අනිවාර්යයෙන්ම සම්මා දිට්ඨිය නැමැති දොරටුවෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගයට පිවිසිය යුතුය කියලා. ස්වාමීන් වහන්ස සම්මා දිට්ඨියට අප පිවිසෙන්නේ කුමන දොරටුවෙන් ද?**

සම්මා දිට්ඨියට පිවිසීමට නිවැරදි දොරටුවක් තිබෙනවා. එම දොරටුව තමයි කල්‍යාණ මිත්‍ර ආශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය, ශ්‍රවණය කළා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කිරීම. මෙන්න මේ දොරටුවෙනුයි සම්මා දිට්ඨියට අවතීර්ණ වෙන්නේ. මෙතන දී කල්‍යාණ මිත්‍රයා කියන්නේ සංසාර භය, සංසාර ගැඹුර කියලා දෙන පින්වතායි. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ධර්ම දේශකයා, ධර්ම කථිකයා කියලා කියන්නේ සංසාර බිය කියලා දෙන පින්වතාය කියලා. යම් පින්වතෙක් ඔබට අනුශාසනා කරනවා නම්, මෛත්‍රී බුදුරජාණන් වහන්සේ දැක නිවන් අවබෝධකොට ගන්න කියලා, එම පින්වතා මිත්‍රයෙක් වෙන්න පුළුවන්, නමුත් කල්‍යාණ මිත්‍රයෙක් වෙන්නේ නැහැ. යම් පින්වතෙක් ඔබට මේ ජීවිතයේ දී උතුම් අධිගමයන් සාක්ෂාත් කොට ගන්න බැහැය කියනවා නම්, ඔහු මිත්‍රයෙක් වෙන්න පුළුවන්. නමුත් කල්‍යාණ මිත්‍රයෙක් වෙන්නේ නැහැ. කළ්‍යාණ මිත්‍ර ආශ්‍රය මේ ලෝකයේ දුර්ලභ දෙයක් කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

කළ්‍යාණ මිත්‍ර ආශ්‍රය ඔබට ලැබුණත්, ඒ හේතුවෙන් සද්ධර්මය ශ්‍රවණය කළත්, එම ශ්‍රවණය කළා වූ ධර්මය ඔබ නුවණින් මෙනෙහි කිරීමට අදක්ෂ නම්, එතනදී ඔබ දුර්වලයෙක් බවටයි පත්වෙන්නේ. ලෝකයේ සිටින ලොකුම අවාසනාවන්තයා බවට ඔබ පත්වෙනවා. මොකද දුර්ලභ කළ්‍යාණ මිත්‍ර ආශ්‍රය ලැබිලා, උතුම් සද්ධර්මය ශ්‍රවණය කරලා, නුවණින් මෙනෙහි කිරීමට ඇති අදක්ෂභාවය නිසාම, ඔබ සම්මා දිට්ඨියට පිවිසීමේ දොරටුවෙන් ඈතට යනවා. මේ නුවණින් මෙනෙහි කිරීමේ අදක්ෂභාවය ඔබ

තුළ සකස්වෙන්නේ කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච-කුක්කුච්ච, විචිකිච්ඡා කියන පංච නීවරණ ධර්මයන් නිසාමයි.

දැන් පින්වත් ඔබට හොඳින් පැහැදිලියි ධර්ම මාර්ගය කියන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයට, ආර්ය අෂ්ටාංගික මාර්ගයට පිවිසීමේ ප්‍රධාන දොරටුව සම්මා දිට්ඨියයි. සම්මා දිට්ඨියට පිවිසෙන නිවැරදි දොරටුව කල්‍යාණ මිත්‍ර ආශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය සහ නුවණින් මෙනෙහි කිරීමයි, ධම්මානුධම්ම ප්‍රතිපදාව කියලා.

## ස්වාමීන් වහන්ස, සම්මා දිට්ඨිය සකස්කොටගත් පින්වතා තුළ, දකින්න පුළුවන් මූලික ලක්ෂණ මොනවා ද?

සම්මා දිට්ඨියට අදාළ ප්‍රධානම කාරණයන් වෙන්නේ..

1. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව
2. මරණින් පසු හේතුඵල ධර්මයන් අනුව නැවත ඉපදීම පිළිබඳ විශ්වාසය
3. කර්මය-කර්ම ඵල විශ්වාසය
4. දන්දීමේ, සිල් රැකීමේ ආනිශංස පිළිබඳ විශ්වාසය
5. අම්මා, තාත්තාගේ ගුණයන් කෙරෙහි විශ්වාසය
6. ඕපපාතිකව සත්ත්වයන් උපදිනවාය කියන විශ්වාසය
7. අතීතයේ අධිගමලාභී උත්තමයින් වැඩ සිටියාය කියන විශ්වාසය

### *තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව*

සම්මා දිට්ඨියට පත්වුණ පින්වතා බුදුරජාණන් වහන්සේගේ ගුණයන්, ඥානයන් කෙරෙහි අවබෝධයෙන්ම විශ්වාසය ඇති කොටගත් කෙනෙක්. අනුන් කියන නිසා නොවේ, පතපොතකින් කියවීම නිසා නොව, ඒ උතුම් සම්බුද්ධ චරිතය, සම්බුද්ධ ඥානයන්,

සද්ධර්මය ශ්‍රවණය කිරීම තුළින්ම, නුවණින් මෙනෙහි කිරීම තුළින්ම බුදුරජාණන් වහන්සේ කෙරෙහි විශ්වාසය ඇතිකොට ගන්නවා. බුදුරජාණන් වහන්සේගෙන් තොර ලෝකයක් සැපයක් දකින්නේ නැහැ. ලෝකයේ සැබෑම ලෞකික, ලෝකෝත්තර සැපයන් ලබා දෙන මාර්ගය සත්ත්වයාට මතුකොට දුන්, ආශ්චර්යවත් උත්තමයා හැටියටයි බුදුරජාණන් වහන්සේව දකින්නේ. බුදුරජාණන් වහන්සේගේ සරණින් පිට ලෝකය මිථ්‍යාදෘෂ්ටික ලෝකයක්. අකුසලයට පාර පෙන්වන, දුගතියට වැටෙන ලෝකයක්. මේ මොහොතේ පින්වත් ඔබ ලබන සතුට, සැනසිල්ල, බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය නිසාමයි අපට ලැබුණේ කියලා දකිනවා. දෑස් පියාගනිද්දි ඔබට මැවිලා පෙනෙන්නේ බුදුරජාණන් වහන්සේගේ රූප කායයි. ඒ අයෝමය සම්බුදු ගුණයේ, ඥානයේ ශක්තිය ඔබේ ජීවිතයට, ධර්ම මාර්ගයට ඔබ ශක්තියක් කොට ගන්නවා. මේ ලෝක ධාතුවේ ශක්තිමත්ම සරණ ඔබ ඔබේ පිහිට කොට ගනිද්දී බිය කියන ධර්මතාවය ඔබෙන් දුරස් වෙලා යනවා.

දෙවැනිව ඔබ ධර්මරත්නය කෙරෙහි විශ්වාසය තහවුරුකොට ගන්නවා. බුදුරජාණන් වහන්සේ මහා කරුණාවෙන් දේශනාකොට වදාළ උතුම් ධර්මය, ධර්ම රත්නය වශයෙන් හඳුන්වනවා. නිවීමේ මාර්ගයට පක්ෂ වෙන්නා වූ, සුගතියට, සැපයට පක්ෂ වෙන්නා වූ සත්තිස්බෝධිපාක්ෂික ධර්මයන් කෙරෙහි අත්දැකීමෙන්ම ලෞකික, ලෝකෝත්තර සැප ලැබෙන මාර්ගය හඳුනා ගන්නවා. සුගතියේ ජීවත් වන හැම සත්වයෙක්ම ධර්මයේ ඵලයක් බවත්, දුගතියේ ජීවත්වන සෑම සත්වයෙක්ම, අධර්මයේ ප්‍රතිඵලයක් බවත් දකිනවා. ධර්මය මග හැරීම, ධර්මයට පිටුපෑම, තමා තමාට කර ගන්නා ලොකුම සතුරුකම බව දකිමින් ධර්මරත්නය කෙරෙහි විශ්වාසය ඇති කොට ගන්නවා. කෙනෙක් පොහොසත් වන්නේ ධර්මානුකූලව සිතපු නිසා බවත්, කෙනෙක් දුප්පත්වන්නේ ධර්මානුකූලව නොසිතපු නිසා බවත් ඔහු දකිනවා. කෙනෙක් ලස්සන වෙන්නේ ධර්මානුකූලව සිතපු නිසා බවත්, තව කෙනෙක් විරූපී වෙන්නේ

ධර්මානුකූලව නොසිතපු නිසා බවත් දකිනවා. බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ චතුරාර්ය සත්‍යය, ආර්ය අෂ්ටාංගික මාර්ගය, පංච උපාධානස්කන්ධය, පටිච්චසමුප්පාද ධර්මය, සතර සතිපට්ඨාන ධර්මයන් තුළින් භවගමනේ දුකත්, භව නිරෝධයේ නිදහස් වීමත් පිළිබඳව මාර්ගය අපිට වටහා දෙනවා. ධර්මය සෑම සත්ත්වයෙක්ගේම ජීවිතයේ කොටසක් වූව ද, අධර්මය කෙරෙහි ඇති ගිජුභාවය නිසාම, තමා තුළින්ම ක්‍රියාත්මකවන ධර්මතාවයන් මගහැරෙනවා. පින්වත් ඔබ ධර්මය හඳුනාගෙන පිහිටකොට ගෙන ජීවිතයට එකතුකොටගත් තැනදී, ලෝකයෙන් නිදහස්වීමේ ධර්මය තමා තුළම සැඟවී තිබූ බවත් ඔබට අවබෝධ වෙනවා. ලෝකයත්, ධර්මයත්, ජීවිතයත්, එකම ක්‍රියාන්විතයක් වෙන තැන දී, මේ ගැඹුරු ලෝකධර්මයන් සම්මා සම්බුද්ධ ඥානයෙන් මතුකොටගත් බුදුරජාණන් වහන්සේ කෙරෙහිත්, ධර්මරත්නය කෙරෙහිත්, අවබෝධයෙන්ම ශ්‍රද්ධාව ඇතිවෙනවා.

සංඝරත්නය කෙරෙහි ශ්‍රද්ධාව සකස්වීමේදී කොණ්ඩඤ්ඤ මහරහතන්වහන්සේගේ පටන් වර්තමානයෙන්, අනාගතය දක්වාත් වැඩ සිටින ගෞරවණීය ස්වාමීන්වහන්සේලාගේ ගුණයන්, ඥානයන් කෙරෙහි විශ්වාසය ඇතිකොට ගන්නවා. බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් ධර්ම මාර්ගය තුන් ලෝකයාටම යහපත පිණිස නොකඩවා ආරක්ෂා කොටගෙන පැමිණෙන්නේ මහාසංඝරත්නයයි. පින්වත් ඔබ මේ මොහොතේ බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව, ධර්මරත්නය කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකොට ගන්නේ, මහා සංඝරත්නයේ අපරිමිත කැපවීම මත මේ උතුම් ධර්මය, උතුම් ප්‍රාතිමෝක්ෂ සීලය ආරක්ෂා කොටගෙන පැමිණි නිසාමය. පින්වත් ඔබ උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කරන මොහොතක් පාසාම, සංඝරත්නයේ ගුණයන්, ඥානයන්මයි දකින්න ඕනේ. උතුම් සීලයන්ගෙන් සංඝයා පිරිහීගිය තැනදී සංඝරත්නය, ලෝකයෙන් අතුරුදහන් වෙනවා. සංඝරත්නය ලෝකයෙන් අතුරුදහන් වෙන මොහොතේදී,

බුද්ධරත්නයේත්, ධර්මරත්නයේත් අර්ථයන් අතුරුදහන් වීම ලෝක ධර්මතාවයක් වෙනවා. එම නිසා පින්වත් ඔබ සංඝරතන්යේ ගුණයන් කෙරෙහි ඇතිකොටගත්තා වූ විශ්වාසය, සම්බුද්ධ ශාසනයේ සුරක්ෂිතභාවයට, ඔබෙන් ලැබෙන දායකත්වයක් වෙනවා. පින්වත් ඔබ, වර්තමානයේදී ස්වාමීන්වහන්සේලාගේ යම් අඩුපාඩු දැක, විවේචනයන් සිදු කිරීම, ස්වාමීන්වහන්සේලා කෙරෙහි අසතුටු සිත් ඇතිකොට ගැනීම තුළින් පින්වත් ඔබ සම්මා සම්බුද්ධ ශාසනය දුර්වල කිරීමට උපකාර ධර්මයන් සකස් කිරීමට උපකාර වුණා වෙනවා. පින්වත් ඔබ සංඝරත්නය කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකොට ගැනීමෙන් සම්මා සම්බුද්ධ ශාසනය සුරක්ෂිත කිරීමේ කාර්යයට ඔබ දායක වෙනවා. ස්වාමීන්වහන්සේලාට නිගරු කරමින්, කොන් කරමින් යමෙක් ශාසනය ආරක්ෂා කිරීමට උත්සාහ කරනවා නම්, එය මිරිඟුවක් බවටයි පත්වෙන්නේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ, සංඝ සමාජයේ යම් දුර්වලතාවයක් ඇතිවෙනවා නම්, ඒවා නිවැරදි කිරීමට ගිහි පින්වතුන්ලාට පැවරීමක් කරලා නැහැ. මෙතනදී වර්තමානයේ ගිහි පින්වතුන්ලා ගොඩාක් පරිස්සම් වෙන්න ඕනේ. පින්වත් ඔබ ස්වාමීන්වහන්සේලා නිවැරදි කිරීමට යාම පසෙක තබා, ඔබ ආදර්ශමත් වීමට උත්සාහ ගන්න. සීලයේ දුර්වල ස්වාමීන්වහන්සේ නමක් දකිනකොට උන්වහන්සේ දෙස නොව, එම ස්වාමීන්වහන්සේ නිසා ගැටෙන ඔබේ සිත දෙස බලන්න දක්ෂ වෙන්න. එවිට ඔබට දැනේවි ප්‍රශ්නය තිබෙන්නේ අදාළ ස්වාමීන් වහන්සේ තුළ නොව ඔබ තුළමය කියලා.

භික්ෂුව හොඳින් දන්න මහත්වරු කිහිප දෙනෙක් සිටිනවා. එම පින්වතුන් ස්වාමීන් වහන්සේලාට උපස්ථානය කිරීමේ දී ස්වාමීන්වහන්සේලාගේ සීලය, සමාධිය, ප්‍රඥාව ගැන සොයන්න යන්නේ නැහැ. සෑම ස්වාමීන්වහන්සේ නමකටම සාරිපුත්ත මහරහතන් වහන්සේ, මුගලන් මහරහතන් වහන්සේ අරමුණු කොටගෙන ඇප උපස්ථාන ධර්මයන් සිදු කරනවා. එම නිසාම එම පින්වතුන් තුළ ගැටෙන සිත්, වෛරී සිත්, ඇතිවෙන්නේ නැහැ.

උපේක්ෂා සහගත සිතිවිලි නිසාම ධර්මයේ අර්ථයන් ජීවිතය තුළින් වැඩෙනවා. ඒ නිසාම තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව එම පින්වතුන්ලා තුළ මෝදු වෙනවා. එසේ නොවී සීලයෙන් දුර්වල ස්වාමීන් වහන්සේ කෙනෙක් නිසා ඔබ ද්වේශයෙන්, වෛරයෙන් යුතුව සැකයක් ඇතිකරගතහොත් එම අකුසලය නිසාම, යම් දවසක ඔබ සිල්වත් ස්වාමීන්වහන්සේලා කෙරෙහිත් ද්වේශය, සැකය ඇති කොට ගන්නවා.

භික්ෂුව දන්න එක්තරා කුටියක් තිබෙනවා. අතීතයේ මේ කුටියේ වැඩ සිටිය ස්වාමීන්වහන්සේ නමක් ප්‍රසිද්ධියේම බරපතළ විනය විරොධී ක්‍රියාවන් සිදු කරලා තිබෙනවා. මේ හේතුව නිසාම වර්තමානයේ සිල්වත් ස්වාමීන්වහන්සේලා මේ කුටියට වැඩියත්, එම ගමේ පින්වතුන් එම ස්වාමීන්වහන්සේලා කෙරෙහි දක්වන්නේ සැකයක්. මේ හේතුවෙන්ම එම පින්වතුන් අප්‍රමාණ අකුසල් සිදුකර ගන්නවා. එම නිසාම පින්වත් ඔබ මහා සංසරත්නය කෙරෙහි ඇති කරගන්නා ශ්‍රද්ධාවම, ඔබ තුළ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකොට ගැනීමට හේතු වෙනවා. පින්වත් ඔබ ස්වාමීන්වහන්සේලාට අදාළව යම් අකැමැති අවස්ථාවන් තිබෙනවා නම්, කරුණාකර එම ස්ථාන මගහැර යන්න. තවදුරටත් ස්වාමීන්වහන්සේලාට අගෞරව කරන්න යන්න එපා. ඒ වගේමයි ගිහි පින්වතුන්ලා තව දුරටත් ස්වාමීන් වහන්සේලා අතර භේදයන්, කළකිරීම් ඇති වෙන ආකාරයට කේලම් කියන්න, බොරු කියන්න යන්න එපා. මෙවැනි අකුසල් නිරයගාමී අකුසල් බවට පත්වෙනවා. සංඝභේදයන් ඇති කිරීමට ගිහි පින්වතුන්ලා උපකාර ධර්මයන් සකස් කොට දුන්නා වෙනවා. බුදුරජාණන් වහන්සේ හතලිස්පස් වසරක් දඹදිව වැඩ සිටියද, බුදුරජාණන් වහන්සේව ජීවමානව නොදැක්ක ජනතාව ලක්ෂ කීයක් දඹදිව සිටින්නට ඇතිද. බුද්ධෝත්පාද කාලයකදීත් එකම රටක ඉපිද බුදුරජාණන් වහන්සේ දැකීමේ අවස්ථාව, පින්වත් ඔබ මෙවැනි අකුසල්වලින් අහිමි කොට ගන්නවා.

## මරණින් පසු හේතුඵල ධර්මයන් අනුව නැවත ඉපදීම පිළිබඳ විශ්වාසය

සම්මා දිට්ඨියේ තවත් ලක්ෂණයක් තමයි, මරණින් පසුව පටිච්චසමුප්පන්නව උපතක් තිබෙනවාය කියන විශ්වාසය. සත්ත්වයා පටිච්චසමුප්පන්නව නැවත උපදින ස්වභාවයන් හතරක් තිබෙනවා. එම ස්වභාවයන් හතර තමයි ජලාබුජ, ඕපපාතික, සංසේජක, අණ්ඩජ. මේ ස්වභාවන් හතරෙන් එකක් මරණින් පසු සත්ත්වයා ලබනවා. පින්වත් ඔබ නැවත උපතක් තිබෙනවාය කියන විශ්වාසය ඇතිකොට ගත්තාට පසුව, ඔබ මොකද කරන්නේ. අනාගත ජීවිතයේ සැපයට අදාළව අකුසලයෙන් බැහැර වී කුසලය තුළ ශක්තිමත් වෙනවා. එක අම්මා කෙනෙක් ඉන්නවා. ඒ අම්මා වයෝවෘද්ධ රෝගීව ජීවත් වන අම්මා කෙනෙක්. භික්ෂුව ඒ අම්මාට ප්‍රකාශ කළා ඔය ජරා ජීර්ණය වෙච්ච රූපය ගැන ආශාව අතහැරලා ජීවිතයේ කරපු පින්කම් ගැන සිහි කරමින් ජීවත්වෙලා, සෑම රාත්‍රියකම දේවතානුස්සතිය වඩන්නය කියලා මරණින් පසු සශ්‍රීක දිව්‍ය තලයක සශ්‍රීක දිව්‍යාංගනාවක් වෙනවාය කියලා. මොකද ඒ අම්මාට අනිත්‍ය සංඥාවක් වැඩීමට දක්ෂභාවයක් නැහැ. ඒ නිසායි දේවතානුස්සතිය වඩන්න කීවේ. ඒ වෙලාවේ ඒ අම්මා කියනවා, මැරිලා මොනවා වෙන්නද වේදනාවක් නැතිව ජීවත්වෙන්නයි ඕනේ කියලා. ඇයට මැරිලා නැවත උපතක් තිබෙනවාය කියලා ස්ථිර විශ්වාසයක් නැහැ. මැරිලා සශ්‍රීක දිව්‍යාංගනාවක් වෙන්න ඇයට කැමැත්තක් නැහැ. ඒ විශ්වාසය ඇයට තිබෙනවා නම්, ඇය කැමැත්තෙන් මරණය භාර ගන්නවා. සමහර පින්වතුන් මැරුණාට පසුව නැවත උපතක් ගැන විශ්වාසයක් නැහැ මරණය තමයි විමුක්තිය වශයෙන් දකින්නේ. ජීවත්ව සිටින තුරු හොඳට කාලා, බීලා, විනෝද වෙලා සතුටු වෙමු, මරණින් පසුව සියල්ල ඉවරයි, කියලයි සමහරු දකින්නේ. සමහර බෞද්ධ පින්වතුන්ලාගෙන් ඇසුවොත් මරණයෙන් පසුව කුමක්ද වෙන්නෙ කියලා, ඒ අය කියන්නේ වෙන දෙයක් වෙච්චාවේ කියලා.

මේ සියලු දෙනාව ගැනෙන්නේ මිථ්‍යාදෘෂ්ටික ස්වභාවයට. සමාජය දෙස හොඳින් ඇස් ඇරලා බලන්නකෝ මනුෂ්‍යයන් සිල්පද බිඳගන්න, මනෝ කර්ම සිදුකර ගන්න වේගය දැක්කාම කීයෙන් කීදෙනෙක් ද සිතලා තිබෙන්නේ, මැරිලා පටිච්චසමුප්පන්න උපතක් තිබෙනවාය කියලා. එවැනි විශ්වාසයක් තිබෙනවා නම් සමාජය මෙච්චර දරුණු වෙයිද, වැරදි කරයිද. පටිච්චසමුප්පන්න උපතක් පිළිබඳව විශ්වාසයක් නොමැති නිසාම එම අර්ථය දුර්වල නිසාම, ලෝභ, ද්වේෂ, මෝහ අකුසලයන් විනෝදාංශයක් කරගෙන ඒවාට ආවඩමින් ජීවිතයේ කොනක් ධර්මයේ ගැටගහලා යන අනතුරුදායක ගමනක් සමාජය ගමන් කරන්නේ. පින්වත් ඔබ පටිච්චසමුප්පන්නව නැවත උපතක් ගැන නියත විශ්වාසයක් ඇති කොටගත් තැනයි අකුසලයෙන් බැහැරව කුසලය තුළ ශක්තිමත් වෙන්නේ. භව ගමනේ අතීතය පිළිබඳවත්, භව ගමනේ අනාගතය පිළිබඳවත් සංසාර බිය ඇතිකොට ගන්නේ.

### ***කර්මය-කර්මඵල විශ්වාසය***

සම්මා දිට්ඨියේ තවත් ලක්ෂණයක් තමයි කර්මය කර්මඵල විශ්වාසය. පින්වත් ඔබ යහපත් දෙයක් කළොත් යහපත් ප්‍රතිඵලයක් ලැබෙනවා. අයහපත් දෙයක් කළොත් අයහපත් ප්‍රතිඵලයක් ලැබෙනවාය කියන විශ්වාසය. යහපත් දේවල් කරලා, යහපත් දෙය විපාක දෙන සුගතිභූමි හතක් තිබෙනවා. ඒවා තමයි තුසිතය, යාමය, නිම්මානරතිය, පරනිම්මිත වසවර්තිය, තාවතිංසය, චතුර්මහාරාජිකය සහ මනුෂ්‍ය ලෝකය. අයහපත් දෙය විපාක දෙන භූමි තමයි සතර අපාය. සතර අපායෙන් නිරය ගත්තොත් නිරයන් එකසිය තිස් හයක් තිබෙනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. යහපත් දෙය විපාක දෙන සුගතිභූමි හතක් පමණක් තිබෙන ලෝකය තුළ අයහපත් දෙය විපාක දෙන නිරයන් පමණක් එකසිය තිස් හයක් තිබෙනවා. බලන්නකෝ ලෝකයේ යහපත් ක්‍රියාවන්ද වැඩි, අයහපත් ක්‍රියාවන්ද කියලා. අයහපතෙනුයි ලෝකය පිරිලා තිබෙන්නේ. මේක තමයි

සම්මා දිට්ඨියේත්, මිථ්‍යාදෘෂ්ටියේත් පරතරය මනින මිණුම් දණ්ඩ වෙන්නේ. පින්වත් ඔබ සිත දෙස බොහොම විමසිල්ලෙන් බලා සිටින්න. ඔබ තුළ සකස්වෙන හැම සිතුවිල්ලක්ම එක්කෝ යහපත පිණිස සකස්වෙන සිතුවිල්ලක්. එක්කෝ අයහපත පිණිස සකස් වෙන සිතුවිල්ලක්.

ඔබ සෑම නිමේෂයකදීම, අනාගත ලෝකයට යහපත සහ අයහපත නිෂ්පාදනය කරමිනුයි සිටින්නේ. පින්වත් ඔබ සිතන්නේ ඔබට යහපත් කීකරු බිරිඳක්, සැමියෙක් ලැබිලා තිබෙනවා කියලා. එය පින්වත් ඔබ සංසාරයේ කරපු යහපත් දෙයක ප්‍රතිඵලයක් වෙනවා. ඔබට ලස්සන රූපයක් ලැබිලා තිබෙනවා නම්, එය යහපත් දෙයක ප්‍රතිඵලයක්. ඔබට දුර්වර්ණ රූපයක් ලැබිලා තිබෙනවා, නම් එය අයහපත් දෙයක ප්‍රතිඵලයක්. රටේ පාලකයා කියන්නේ යහපත් දෙයක ප්‍රතිඵලයක්. යාචක මහත්මයෙක් කියන්නේ අයහපත් දෙයක ප්‍රතිඵලයක්. ගැටෙන්න දෙයක් මෙතන නැහැ. අවබෝධයෙන් නිවැරදි වෙන්නයි තිබෙන්නේ. එය සම්මා දිට්ඨියේ ලක්ෂණයක්. මේ මොහොතේ භික්ෂුවට ගොඩාක් පින්වතුන් ගරු කරනවා. එය භික්ෂුව සංසාරයේ කරපු යහපත් දෙයක ඵලයක්. හෙට භික්ෂුවට ලෝකයම නිගරු කරන්න පුළුවන්. එයත් භික්ෂුව සංසාරයේ කරනු ලැබූ අයහපත් දෙයක ඵලයක්. ධර්මමාර්ගයේ ගමන් කරනකොට, පින්කම් සිදුකරන කොට පුංචි වැරදීමකින් ගැටෙන සිත් ඇති කරගන්න නරකයි. අනෙක් අයත් ගැටෙන ස්වභාවයට යොමු කරන්න නරකයි. අයහපත් සිතුවිල්ලක සැඟවී ඇති දුකත්, යහපත් සිතුවිල්ලක සැඟවී ඇති සැපයත්, හඳුනා ගැනීමට දක්ෂ පින්වතා තුළයි කර්මය කර්මඵල විශ්වාසය ඇතිවෙන්නේ. එය සම්මා දිට්ඨියේ උතුම් ලක්ෂණයයි.

### *දන්දීම, සිල් රැකීමේ ආනිසංස පිළිබඳ විශ්වාසය*

සම්මා දිට්ඨියේ තවත් ලක්ෂණයක් තමයි දන්දීමෙන්, සිල්පද රැකීමෙන් ආනිශංස තිබෙනවාය කියන විශ්වාසය. දන් දීමෙන් පෙරළා අපිට ලැබෙන ආනිශංශ මොනවා ද? ආයුෂ, වර්ණය, සැපය, බලය. රජ කෙනෙක්, සිටුකෙනෙක්, සශ්‍රීක දෙවිකෙනෙක් කියන්නේ කවුද? දන්දීමේ ඵලයක්. දූන් කැළයේ ජීවත් වන ආයුෂ වර්ණය, සැපය, බලය වැඩි අලියා, සිංහයා, කොටියා වැනි සතුන් පෙර මනුෂ්‍ය ජීවිතවල ඉපදිලා කර්මය කර්මඵල විශ්වාසයෙන් තොරව දන්දීපු අය. ඒ අය සීලයට ගරු කරන්නේ නැහැ. ප්‍රේත ලෝකවල, අසුර ලෝකවල සද්ධන්ත ප්‍රේතයින් අසුරයින් ජීවත් වෙනවා. මේ අයට සද්ධන්තභාවය ලැබෙන්නේ පෙර ජීවිතවල දානයේ ඵලය නිසාමයි. මැරෙන වේලාවේ සකස්වුණ ලෝභී සිතක් නිසා ප්‍රේත, අසුර ලෝකයන්ට වැටුණත් දානයේ ආනිසංශ නිසා ආයුෂ, වර්ණය, සැපය, බලය වැඩි අය බවට පත්වෙනවා.

සීලයෙන් ලැබෙන ආනිසංශ මොනවා ද? සිල් රකින පින්වතාගේ කීර්තිරාවය පැතිරී යනවා. ඕනෑම සභාවක් ඉදිරියට නොබියව යනවා. සිහිමුලා නොවී මැරෙනවා. සුගතියේ උපදිනවා. මනුෂ්‍යයෙක්, දෙවියෙක්, බ්‍රහ්මයෙක් කියන්නේ කවුද. සීලයේ ඵලයක්. ධනයෙන්, නිලයෙන්, බලයෙන් පවුල් ජීවිතයෙන් පරිපූර්ණත්වයට පත්වෙලා ජීවත්වන මනුෂ්‍යයෙක් කියන්නේ කවුද? පෙර ජීවිතයේ දානයෙත්, සීලයේත් ඵලයයි, කියන විශ්වාසය අපිට තිබෙන්න ඕනේ. මේ විශ්වාසය අපි තුළ නැති තැනදී, ඇති හැකි අයට, දක්ෂ අයට, ධනවත් අයට නිරතුරුවම සමාජය වෛර කරන්න, ද්වේෂ කරන්න පෙළඹෙනවා. පංති පරතරය නිසා සමාජය තුළ මොන තරම් ගැටුම්, යුද්ධ, මිනිස් ඝාතන සිදුවෙනවා ද? ඇයි සමාජය මේ ගැටුම්කාරී තත්ත්වයට යන්නේ. සීලයේ දානයේ ආනිශංස පිළිබඳව විශ්වාසයෙන් තොරව සමාජය දෙස බැලීම නිසා. සමාජයේ මනුෂ්‍යයෙක් ලබන උතුම් කුසල් සංස්කාරයන්ගේ ඵලයන්ට ඔබ ද්වේෂ කරනවා නම්, ඒ ඔබ ද්වේෂ කරන්නේ ධර්මයට බව හඳුනාගත යුතුව තිබෙනවා.

දානයේ, සීලයේ ආනිශංස කෙරෙහි විශ්වාසය ඇති පින්වතා තව කෙනෙක් ලබන සැපයට අසාධාරණයක්ය කියලා සටන් කරන්න යන්නේ නැහැ. සමාජ අසාධාරණය කියන මිථ්‍යාව අතහැර සංස්කාරයන්ට අදාළව ලෝකය දකිනවා. බුදුදහම තුළින් පංති විරහිත සමාජයක්, කොමියුනිස්ට්වාදය, සමාජවාදය කියන කාරණාවන් ප්‍රතික්ෂේප වෙනවා. කෙනෙකුගේ ධනවත් භාවය, බලවත්භාවය, රූමත්භාවය, කුලවත්භාවය සංස්කාරයන්ගේ ඵලයක්ම මිස, හුදු දේශපාලන ධර්මතාවයක් නොවන බව, ධර්මය තුළින් මොනවට පැහැදිලි වෙනවා. දානයේ සීලයේ ආනිශංස පක්ෂය විශ්වාස පින්වතා අනුන්ගේ සැපයට ගැටෙන්නේ නැතුව තමා දානය තුළ, සීලය තුළ ශක්තිමත් වී අනාගත සැපයට අදාළ ධර්මතාවයන් රැස්කොට ගන්නවා. සිදුහත් කුමාරයා සශ්‍රීක රජසැප ලබන්නේ රම්‍ය, සුරම්‍ය, සුභ මාලිගා ලබන්නේ, දඹදිව ජීවත් වූ සැපයෙන් ආඪ්‍ය කුමාරයෙක් ලෙස සැප සම්පත් ලැබූවේ පෙර දානයේත්, සීලයේත් ඵලයක් නිසාම බව පින්වත් ඔබ තේරුම් ගත් තැනදී, විශාඛා සිටු දියණියට ලක්ෂ ගණනක් වටිනා ඇය පැළදි මහාමේල පළඳනාව ලැබෙන්නේ පෙර දන්දීමේ ආනිශංශ වල ඵලයක් හේතුවෙන් බව තේරුම් ගනිද්දී, අනුන්ගේ සැපයට වෛර නොකොට දානයේ සීලයේ ආනිසංශයන්ගේ උත්කෘෂ්ටභාවය දැකීම සම්මා දිට්ඨියේ උතුම් ලක්ෂණයක් වෙනවා.

### ***අම්මා, තාත්තාගේ ගුණයන් කෙරෙහි විශ්වාසය***

සම්මා දිට්ඨියේ තවත් ලක්ෂණයක් තමයි, අම්මා, තාත්තාගේ ගුණයන් කෙරෙහි ඇතිකොටගත් විශ්වාසය. මහා බ්‍රහ්මයා ලෝකය දෙස බලන මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා ගුණයන්ගෙන් අම්මා, තාත්තා පරිපූර්ණයි. ඒ උතුම් ගුණයන්ගෙන් උණුවෙන රත්වෙන රුධිර ධාතුව, මව්කිරි බවට පත් කිරීමෙනුයි අම්මා ඔබව පෝෂණය කරන්නේ. මව්කුසක ඇතිවෙන කලල රූපය, දස මසකින් දරු සිගිත්තෙක් බවට පත්කරන්නේ. ඒ අම්මා, තාත්තා තුළ ඇති

මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා ගුණයන් නිසාමයි. මහා බ්‍රහ්මයා ඔබ දෙස බලන මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා ගුණයන් තුළින් අම්මා, තාත්තා ඔබ දෙස බලනකොට, ඔබ ඒ අම්මා තාත්තා දෙස බැලිය යුත්තේ මහා බ්‍රහ්මයා දෙස බලන ගෞරවයෙන්මයි. එවැනි ගෞරවණීය සිතුවිල්ලක් තුළ, පින්වත් ඔබට මතු භවයක ශක්‍රයා බවට පත්වීමට අවශ්‍ය කුසල් ධර්මයන් සැඟවී තිබෙනවා. ලක්ෂ ගණන් දරුවන් අම්මා, තාත්තාගේ රැකවරණය අහිමිව ළමා නිවාසවල තනිවෙද්දී, තවත් දරුවන් ළමා මෙහෙකාර කටයුතුවල නියැලෙද්දී, පින්වත් ඔබට රටක් වටිනා අම්මා, තාත්තා කෙනෙක් ලැබුණේ පින්වත් ඔබ පෙර ජීවිතයේදී අම්මා, තාත්තාගේ ගුණයන් හඳුනාගෙන අම්මා, තාත්තාට උපස්ථානය කරපු නිසාමයි. අම්මා, තාත්තාගේ සිනහවක, මුත්‍රා බිඳුවක, අසූචි පිඩක, කිලිටි ඇඳුමක සැඟවී තිබෙන දිව්‍යමය සැපය ඔබට මතුකොට දෙන්නේ, උතුම් සම්මා දිට්ඨිය තුළින්මයි. දෙමාපියන් තුළ තිබෙන මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා ගුණයන්ට ලෝකයට බුදුරජාණන් වහන්සේ නමක්, රහතන් වහන්සේ නමක්, ශක්‍රයෙක් බිහි කිරීමට හැකියාව තිබෙනවා. මෙවන් උතුම් අම්මා, තාත්තාව ඔබ අනවබෝධයෙන් හඬවන්න එපා. කඳුලක්, දුකක් දෙන්න එපා. ඔබේ සතුට ඔබේ දෙමාපියන්ගේ සතුට උදෙසා කැප කරන්න. ඒ දෙදෙනා සතුටින් ඉන්නවා දකලා, පින්වත් ඔබ සතුටු වෙන්න.

කුකුළු ගොවිපොළවල බිත්තර දහස් ගණන් රක්කනවා. එම බිත්තර රක්කවන්නේ උණුසුම් යන්ත්‍ර වලින්. මේවායින් ලෝකයට බිහිවන බ්‍රොයිලර් කුකුල් පැටවුන්ට අම්මා කෙනෙක්ගේ ආදරයක් උණුසුමක් රැකවරණයක් ලැබෙන්නේ නැහැ. මෙය මේ සතුන් ලබන අකුසල් විපාකයක්. සංසාරයේ අම්මා, තාත්තාට සැලකුවේ නැහැ. දෙමාපියන්ගේ ගුණයන් හඳුනාගෙන ඒවාට කෘතගුණ සැලකුවේ නැහැ. දෙමාපියන් නැති දරුවන් වශයෙන් ලෝකයට බිහිවෙනවා. තලගොයෙක්, කිඹුලෙක් ගන්නකෝ, පූසෙක් ගන්නකෝ. තමාගේම කුසෙන් බිහිවන පැටවා මරාගෙන කනවා. මෙම සත්ත්ව අම්මලා

කියන්නේ පෙර මනුෂ්‍ය ජීවිතවල බිඳ වැටුණු මව්පිය, දූදරු සම්බන්ධතාවයේ ප්‍රතිඵලයන්. අම්මා තාත්තාගේ කඳුලක සැඟවී ඇති දුගතියත්, අම්මා, තාත්තාගේ සිනහවක සැඟවී ඇති සුගතියත්, පින්වත් ඔබට මතුකොට දෙන්නේ සම්මා දිට්ඨිය තුළින්මය. එය සම්මා දිට්ඨියේ උතුම්ම ලක්ෂණයක් වෙනවා.

### ඕපපාතිකව සත්ත්වයන් උපදිනවාය කියන විශ්වාසය

සම්මා දිට්ඨියේ තවත් ලක්ෂණයක් තමයි ඕපපාතිකව සත්ත්වයන් උපදිනවාය කියන විශ්වාසය. ප්‍රේතයා, දෙවියා, බ්‍රහ්මයා, යක්ෂයා, අසුරයා, නිරිසතා, ප්‍රේත තිරිසන් සතුන් උපත ලබන්නේ ඕපපාතිකව. නවීන විද්‍යාව පැත්තට බර දීලා, ධර්මය ගැන සිතන පින්වතුන්, ඕපපාතිකව සත්ත්වයින් උපදිනවාය කියලා විශ්වාස කරන්න මැලි බවක් දක්වනවා. පින්වත් ඔබට ඕපපාතිකව සත්ත්වයින් උපදිනවාය කියලා විශ්වාසයක් නැතිනම්, ප්‍රේත ලෝකයක්, නිරයක් ගැන විශ්වාසයක් ඔබට නැතුව යනවා. එම නිසාම ඔබ තුළින් අකුසලයට ඇති බිය නැති වී යනවා. ඒ වගේමයි, දෙවියන්, බ්‍රහ්මයන් සිටිනවාය කියන විශ්වාසය හීනවීම නිසාම ඔබ කුසලයට ඇති කැමැත්ත හීන කර ගන්නවා. ඕපපාතිකව උපදින සත්ත්වයෙකුගේ ප්‍රතිසන්ධිය පින්වත් ඔබට දැකීමට නම් අනිවාර්යයෙන්ම ඔබ සමාධිය ප්‍රගුණකළ යුතු වෙනවා. සමාධිය තුළින් ඔබ සකස්කොට ගන්නා වූ චුතූපපාත ඥාණය, ඕපපාතිකව සත්ත්වයින් උපදිනවාය කියන විශ්වාසය ඔබ තුළ ඇති කොට දෙනවා. පින්වත් ඔබ තවමත් මේ ඥාණයන් නොලැබූ නිසාමයි, සංසාර බිය තවමත් නොදකින්නේ. සම්මා දිට්ඨියේ පරිපූර්ණභාවය ඇති කර නොගන්නේ.

භික්ෂුවක් උතුම් සමාධියෙන් පසුවන කොට එම භික්ෂුවට අරමුණු වෙනවා ඕපපාතිකව යක්ෂයෙක් උපදිනවා. පැරණි ආරණ්‍ය භූමියක කළුගල් කුටියක වැඩ සිටින අවස්ථාවකයි භික්ෂුවට මෙම සිද්ධිය සමාධිය තුළින් දර්ශනය වෙන්නේ. භික්ෂුවට මීටර්

20 ක් පමණ ඈතින් අඩි හයක් පමණ උසින් එක් ක්ෂණයකින්ම වේගවත් සුළියක් පහළ වෙනවා. භික්ෂුව උතුම් සමාධිය තුළිනුයි මේ වේගවත් සුළිය දකින්නේ. මේ සුළිය ඉතාමත් අධිවේගයකින් භ්‍රමණය වෙලා, භ්‍රමණය වෙලා, යක්ෂයාගේ රූපය නිර්මාණය වෙනවා. ඒ කියන්නේ යක්ෂයා ඕපපාතිකව උපත ලබනවා. පෙර ජීවිතයෙන් සංඛාර පච්චයා විඤ්ඤාණං කියන ධර්මතාවය යටතේ සකස්වුණ චුතිසිත, අනිත්‍යභාවයට පත්වීම හේතුවෙන් සකස්වුන ප්‍රතිසන්ධි චිත්තයයි, "විඤ්ඤාණය". මේ වේගවත් සුළිය හැටියට භික්ෂුවට අරමුණු වෙලා තිබෙන්නේ. එම භික්ෂුව එතැනදී දකින්නේ විඤ්ඤාණයේ වේගවත් භාවය විසින්ම ඕපපාතිකව සත්ත්වයා උපත ලබන බවයි. මෙන්න මේ ඕපපාතික සත්ත්වයන් උපදිනවාය කියන විශ්වාසය සම්මා දිට්ඨියේ උතුම් ලක්ෂණයක් වෙනවා.

### *අතීතයේ අධිගමලාභී උත්තමයින් වැඩසිටියාය කියන විශ්වාසය*

සම්මා දිට්ඨියේ උතුම් ලක්ෂණයක් තමයි, අතීතයේ සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අරහත් උත්තමයින් සිටියාය කියන විශ්වාසය. ධර්මය සංදිට්ඨිකව තිබෙන තාක්කල් මේ උතුම් අධිගමයන් සාක්ෂාත් කර ගැනීමට හැකිය කියන විශ්වාසය සම්මා දිට්ඨියේ ලක්ෂණයක් වෙනවා. යම් පින්වතෙක් තුළ අතීතයේ අධිගමලාභීන් නොසිටියාය කියලා දැක්මක් ඇතිවුණොත් එම දුර්මතය නිසාම ඔහුට මාර්ගඵල ලාභියෙක් වීමට අවශ්‍ය සාධක, වීර්යය නැතිකොට ගන්නවා. නිවන් මාර්ගය කෙරෙහි විශ්වාසයෙන් බැහැර වී භව මාර්ගයටයි ඔහු වැටෙන්නේ. මේ දුර්මතය නිසාම ඔහුට තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකොට ගැනීමේ කාර්යය අඩපණවෙලා යනවා. සංසරත්නයේ උතුම් ගුණයන් ඥාණයන් කෙරෙහි විශ්වාසය හීනවීම නිසාම කුසල් පක්ෂය වඩවාගැනීමේ කාරණයේ දී බලවත් පසුබෑමකට ඔහු පත්වෙනවා. ඒ වගේමයි උතුම් සද්ධර්මය සන්දිට්ඨිකව තිබෙන මොහොතක අවංකවම උතුම් රහත්ඵලයට පත් වූ ස්වාමීන්වහන්සේ නමක්

මුණගැසුන ද, උන්වහන්සේලා කෙරෙහි සැක ඇතිකොටගෙන බරපතල වූ අකුසලයන් කරා ගමන් කරනවා. එම නිසා අතීතයේ අධිගමලාභීන් සිටියාය කියලා ඇතිකොටගන්නා වූ විශ්වාසය සම්මාදිට්ඨියේ උතුම් ලක්ෂණයක් වෙනවා.

පින්වත් ඔබ යොමු කරපු ප්‍රශ්නය තමයි සම්මාදිට්ඨියේ ලක්ෂණ මොනවා ද කියලා. ඊට අදාළ කාරණා හතක් ඉහතින් සඳහන් කරලා තිබෙනවා. මෙම කාරණා ශාසනයේ දොරටුව හැටියට දකිමින් ඔබේ ජීවිතයට එකතුකොට ගන්න, දක්ෂවෙන්න. මේ උතුම් සම්මාදිට්ඨිය ඇතිකොටගත් තැනැත්තායි ආර්ය අෂ්ටාංගික මාර්ගයට අවතීර්ණ වෙන්නේ.

## ස්වාමීන් වහන්ස සම්මා දිට්ඨියේත්, ලෝකෝත්තර සම්මා දිට්ඨියේත් වෙනස කුමක් ද?

භික්ෂුව ඉහතින් සඳහන් කළේ ලෞකික සම්මා දිට්ඨිය ගැනයි. පින්වත් ඔබ කොතෙක් ලෞකික සම්මා දිට්ඨිය ජීවිතයට එකතුකොට ගත්ත ද, එහි ඵලය හැටියට පින්වත් ඔබට ලැබෙන්නේ දිව්‍ය, මනුෂ්‍ය, සුගතියේ උපතක් පමණක්මයි. පින්වත් ඔබ අතීතයේ ගෙවාගෙන පැමිණි සම්මා සම්බුද්ධ ශාසනවලදී ඔබ ලෞකික සම්මා දිට්ඨියෙන් ඔබ්බට සිත පිහිටුවා නැහැ. ඒ නිසාම පින්වත් ඔබ සම්මා දිට්ඨිය ප්‍රයෝජනයට අරගෙන සුගතිගාමී උපතක් ලැබීම පමණකින්ම සෑහිමකට පත්වෙලයි තිබෙන්නේ. ලෞකික සම්මා දිට්ඨිය විදර්ශනා නුවණින් දකින තැනයි, ලෝකෝත්තර සම්මා දිට්ඨිය සකස්කොට ගන්නේ.

දැන් ඔබ සිතන්න, ඔබ කොච්චර තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් ජීවත්වුණත්, ඔබට ලැබෙන්නේ කුමක් ද, සුගතියේ උපතක් පමණක්මයි. ඔබ මැරෙන වෙලාවට අවසාන චුති සිතට බුදුරජාණන් වහන්සේ සිහිපත් වුණොත්, බුදුගුණයක් සිහිපත් වුණොත් මොක ද

වෙන්නේ, ඔබ සුගතියේ දිව්‍ය, මනුෂ්‍ය ජීවිතයක් ලබනවා. එම දිව්‍ය මනුෂ්‍ය සැපය නිත්‍යද? අනිත්‍ය ද? අනිත්‍යයි.

මෙන්න මේ සංස්කාරයන්ගේ අනිත්‍යභාවය නුවණින් දකිමින් ඔබ මැරෙන වෙලාවට චුති සිතට අරමුණු වෙන බුදුරජාණන් වහන්සේගේ රූපය, බුදු ගුණය අනිත්‍ය වශයෙන් ඔබ දකින්න දක්ෂ නම්, එතැනදී ඔබ ලෝකෝත්තර සම්මාදිට්ඨියට පත් වුණා වෙනවා. මේ විදර්ශනාමය, ලෝකෝත්තර සම්මා දිට්ඨියයි, ඔබව සෝවාන් ඵලයට, පංචඋපාදානස්කන්ධයේ අනිත්‍ය දුක්ම දෙසට යොමුකරන්නේ.

ඔබ කොච්චර කර්මය කර්මඵල විශ්වාසයෙන් දන් දුන්නත්, සිල් සමාදන් වුණත්, ඔබට කුමක් ද ලැබෙන්නේ. සුගතියේ උපතක්. එම සුගතියේ උපත නිත්‍යයද, අනිත්‍යය ද? අනිත්‍යයි.

මෙන්න මේ සංස්කාරයන්ගේ අනිත්‍යභාවය නුවණින් දැකලා, සංස්කාරයන්ට නොබැඳී සිටින තැනයි, ලෝකෝත්තර සම්මා දිට්ඨිය වෙන්නේ. පින්වත් ඔබ දන්දීම නිසා, සිල් ආරක්ෂා කිරීම නිසා ඔබ මැරෙන වෙලාවේ චුති සිතට, ඔබට දිව්‍යඵලයක්, දෙවියෙක්, ප්‍රභාශ්වර ආලෝකයක්, ලස්සන මල් ගොමුවක් අරමුණු වුණොත් ඔබ එම රූපයන් අනිත්‍ය වශයෙන් දකිනවා. එසේත් නැතිනම් එම රූපයන් නිසා සකස්වුණ සිත, අනිත්‍ය වශයෙන් දකින තැන සකස්වෙන විදර්ශනා අංග ලෝකෝත්තර සම්මා දිට්ඨියේ ලක්ෂණයක් වෙනවා. සංස්කාරයන්ට බැඳුනොත් සුගතියේ උපදිනවා. එය ලෞකික සම්මා දිට්ඨියේ ඵලයක්. සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දැක්කොත් ලෝකෝත්තර සම්මා දිට්ඨිය සකස් වෙනවා. එය ඔබ තුළ විදර්ශනා නුවණ ඇතිකොට භව නිරෝධය දෙසට යොමු කරවනවා. පින්වත් ඔබ සිතන්න. ඔබ ඔබේ අම්මා, තාත්තාව කරේ තබාගෙන මුළු ජීවිත කාලයම උපස්ථානය කළා කියලා. එම මව්පිය උපස්ථානයට ඔබට ලැබෙන ඵලය කුමක් ද? සුගතියේ උපතක්. එම සුගතියේ උපත නිත්‍ය ද? අනිත්‍ය ද? අනිත්‍යයි.

ඔබ විවේකීව සිතන්න, සංසාරයේ ඔබ කොතෙක් අම්මා තාත්තාට උපස්ථානය කරන්න ඇති ද. නමුත් ඔබට ලැබුණේ අනිත්‍ය වන සුගතියේ උපතක් පමණයි. එම පින පිරිහී ගිය තැන ඔබව නැවත සතර අපායට වැටෙනවා. එම නිසා පින්වත් ඔබ මව්පිය උපස්ථානය කරමින්, එම කුසල් සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකිමින් එම සංස්කාරයන්ට නොබැඳෙන තැන එම සංස්කාරයන්ට කළකිරෙන තැන, පංචඋපාදානස්කන්ධ ධර්මයන්ගේ අනිත්‍යභාවය දැකීම තුළ ලෝකෝත්තර සම්මා දිට්ඨිය ඔබ තුළින් අර්ථවත් වෙනවා.

පින්වත් ඔබ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකොටගෙන දන් දෙමින්, සිල් රකිමින්, මව්පිය උපස්ථානය කරමින්, පටිච්චසමුප්පන්නව නැවත උපත ගැන විශ්වාසය ඇතිකර ගනිමින්, ඕපපාතිකව සත්ත්වයන් උපදින බව දකිමින්, අතීතයේ අධිගමලාභීන් සිටියාය කියන විශ්වාසය ඇති කොට ගනිමින්, මේ සෑම සංස්කාරයන්ම වෙනස්වන බව, අනිත්‍ය වෙන බව නුවණින් දකිමින්, එම සංස්කාරයන්ට නොඇලී, නොබැඳී සකස්කොට ගන්නා විදර්ශනා දැකීම ලෝකෝත්තර සම්මා දිට්ඨියේ ලක්ෂණය වෙනවා. පින්වත් ඔබ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා දිට්ඨිය, ලෝකෝත්තර සම්මා දිට්ඨියක් බවට පත්කොටගත් තැනදී මුළු ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ඉතිරි අංග හතම, ඔබ තුළ වැඩෙන්නේ විදර්ශනා නුවණ වැඩෙන ලෝකෝත්තර ආර්ය අෂ්ටාංගික මාර්ගය හැටියටයි.

මුලින්ම පින්වත් ඔබ ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ශක්තිමත් වෙන්න. එම සංස්කාර ඔබව සුගතියට ඔසවා තබනවා. සුගතිය තුළ සිත පිහිටලා, කුසලය තුළ සිත පිහිටලා එම සුගතියත්, කුසලයත් අනිත්‍ය බව සංස්කාරයක් බව දැකලා විදර්ශනා නුවණ ඇති කොට ගන්න. එය ලෝකෝත්තර සම්මා දිට්ඨියේත්, ලෝකෝත්තර ආර්ය අෂ්ටාංගික මාර්ගයෙත් අර්ථය වෙනවා.

## ස්වාමීන් වහන්ස සම්මා දිට්ඨිය පරිපූර්ණ වුණ තැනදී කුමක් ද සිද්ධවෙන්නේ ?

සම්මා දිට්ඨිය පරිපූර්ණ වුණ තැනදී සම්මා සංකප්පයෙන් පරිපූර්ණ භාවයට පත්වෙනවා. සම්මා සංකප්පයන් කියන්නේ අවිහිංසා සංකප්ප, අව්‍යාපාද සංකප්ප, නෙක්ඛම්ම සංකප්ප කියන කාරණා තුනයි. අවිහිංසාව කියන්නේ ඔබ කාටවත් හිංසා කරන්නේ නැහැ. මෙතනදී හිංසාව කියලා කියන්නේ කෙනෙකුට ගහනවා, බනිනවා, මරණවා පමණක් නොවේ. පින්වත් ඔබ තව කෙනෙකුට වචනයකින්, ඉරියව්වකින් හෝ පීඩාවක් කරනවා නම් එය හිංසාවක් බවටයි පත්වෙන්නේ. රැකියාවක් කරන, ව්‍යාපාරයක් කරන පින්වත් ඔබට අවිහිංසා සංකප්පය ගැන අවදියෙන් සිටීම හුඟාක් ප්‍රයෝජනවත් වෙනවා. ඔබේ රාජකාරි ජීවිතයේ දී ඔබ ඉදිරියට පැමිණෙන සේවාදායකයාට, ඔබ අවශ්‍ය කාරණය, රාජකාරිය සිදුකරදීමට ප්‍රමාද කරනවා නම්, අද කළ හැකිව තිබුණ දෙය කර දෙන්න ලබන සතියේ එන්න කියනවා නම්, අල්ලස් බලාපොරොත්තු වෙනවා නම්, පින්වත් ඔබ ඒ මොහොතේම අවිහිංසා සංකප්පයන්ගෙන් බැහැර වෙනවා. වෙළඳ මහත්මයෙක් අධික ලාභයක් ලබමින්, බාල භාණ්ඩයක් විකුණන මොහොතේම අවිහිංසා සංකප්පයෙන් බැහැරව යනවා. තමාගෙන් කෙනෙකුට විය යුතු රාජකාරි, යුතුකම පැහැර හරින මොහොතේම, ඔබ සම්මා සංකප්පයන්ගෙන් බැහැරව යනවා. පින්වත් ඔබ නුවණින් මෙනෙහි කොට දකින්න. ඔබේ රාජකාරි ජීවිතයේ දී ඔබ කොතෙක් නම් අවිහිංසා සංකප්පයන්ගෙන් බැහැරව යනවා ද කියලා. තමන් ඉදිරියට පැමිණෙන සේවාදායකයාට ඔබේ ආයතනයේ පවතින නීති රාමුව තුළ ඔහුගේ අවශ්‍යතාවය ඉටුකර දීමට ඔබට නොහැකි වෙන්න පුළුවන්. ඒත් ඔබ දක්ෂවෙන්න තම අවශ්‍යතාවය ඉටුනොවුන ඔහුව සිනහවකින්වත් සතුටු කොට යවන්න. ඔබ සිනාවකින් ඔහුව සතුටු කරන මොහොතේ ඔබ අවිහිංසා සංකප්පය ජීවිතයට එකතු කොට ගත්තා වෙනවා. අසරණභාවයට පත්වෙන මනුෂ්‍යයන් ඉදිරියේ ඔබ

ඇතිකොට ගන්නා නිර්ව්‍යාජ සිනහව ඔබ තුළ අවිහිංසා සංකප්පය මෝදු කොට දීමට උපකාර වෙනවා. මගී ප්‍රවාහන සේවය තුළ ඇති තරගකාරීභාවය නිසා මුදල් පසුපස හඹායෑම හේතුවෙන් එම සේවයේ යෙදෙන පින්වතුන් අතින් දිනකදී බරපතළ ආකාරයෙන් අවිහිංසා සංකප්පයෙන් බැහැරවීම් සිදු වෙනවා. පින්වත් ඔබ මෙම දුර්වලභාවයන් හඳුනාගෙන ඔබේ රාජකාරී ජීවිතය අවිහිංසා සංකප්පයන් වැඩෙන රාජකාරී ජීවිතයක් බවට පත්කර ගන්න. ළමා මෙහෙකරුවන්, ගෘහ සේවක සේවිකාවන්, ආරක්ෂක සේවාවන් හේතුවෙන් සමහරක් පින්වතුන්ලා නිරතුරුවම අවිහිංසා සංකප්පයන්ගෙන් බැහැර වෙනවා.

අවිහිංසා සංකප්පයන්ගෙන් බැහැර වුණ තැන දී අව්‍යාපාද සංකප්පයෙන් බැහැරව යෑම අනිවාර්යයෙන්ම සිද්ධ වෙනවා. පින්වත් ඔබ රාජකාරී ජීවිතයේදී ඇතිවන කාර්යය බහුලභාවය හේතුවෙන් නිරතුරුවම කේන්තිය, ද්වේෂය, නොරිස්සුම් ස්වභාවය ඇතිකොට ගන්නවා. තවත් පුද්ගලයෙකුගේ ඉරියව් පැවැත්මක් නිසා කේන්තිය ඇති කොටගන්නවා. මගතොටේදී, වාහන තදබදයකදී, නිරතුරුව අව්‍යාපාද සංකප්පයන්ගෙන් බැහැරට ගොස් ව්‍යාපාදය ඇති කොට ගන්නවා. ගෘහ ජීවිතයේ දී සැමියා නිසා, බිරිඳ නිසා, දරුවන්-දෙමාපියන් නිසා, මොනතරම් නම් කේන්තියෑම් ඇතිකොට ගන්නවා ද. පින්වත් ඔබ රාජකාරී ජීවිතයේදී, ගෘහ ජීවිතයේදී අව්‍යාපාද සංකල්පය ආරක්ෂා කොටගෙන ජීවත්වීමට දක්ෂනම් නිරතුරුව ඔබ සම්මා සංකප්පයන් තුළ ජීවත්වන පින්වතෙක් වෙනවා. පින්වත් ඔබ ව්‍යාපාදයක්, කේන්තියක් සකස්වෙන සෑම මොහොතකදීම ඔබ ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් බැහැරව ගිය පුද්ගලයෙක් වෙනවා.

අවිහිංසා සංකප්පයන්, අව්‍යාපාද සංකප්පයන් වැඩීම දුර්වලවෙන තැන දී, අනිවාර්යයෙන්ම නෙක්ඛම්ම සංකප්පය වැඩීම දුර්වල වෙනවා. නෙක්ඛම්මය කියන්නේ අතහැරීම. කුමක් ද අතහරින්නේ,

ලෝභ, ද්වේශ, මෝහයන් අතහැරලා අලෝභ, අද්වේෂ, අමෝහයන් තුළට එනවා. පින්වත් ඔබ ලෝභ සිතක්, ද්වේශ සිතක්, මෝහ සිතක් ඇති කරගන්නා මොහොතක් පාසාම සම්මා සංකප්පයන්ගෙන් බැහැරව යනවා. හිංසාව සහ ව්‍යාපාදය අකුසල මූලයන්ට පාවඩයක් වෙනවා.

සම්මා දිට්ඨියත්, සම්මා සංකප්පයත් ප්‍රඥාවට අදාළ අංගයන් හැටියටයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. එම නිසා ධර්ම මාර්ගයේ ගමන් කරන පින්වතුන්ලා ඉහත අංග දෙකටම අදාළ අර්ථයන් නිවැරදිව ජීවිතයට එකතුකොට ගැනීම අත්‍යාවශ්‍ය වෙනවා. මෙම අංග දෙක වැඩීම තුළ ලැබෙන ශක්තිය මුළු ආර්ය අෂ්ටාංගික මාර්ගයම ශක්තිමත් කරනවා. පින්වත් ඔබ ඇතිකොටගන්නා අවිහිංසා සිතුවිල්ලක්, අව්‍යාපාද සිතුවිල්ලක්, නෙක්ඛම්ම සිතුවිල්ලක් යනු සම්මා දිට්ඨියෙන් පෝෂණය වුන සම්මා සංකප්පයක් බවට පත් වෙනවා.

## ස්වාමීන් වහන්ස සම්මා සංකප්පයක්, ලෝකෝත්තර සම්මා සංකප්පයක් බවට පත්කරගන්නේ කෙසේ ද?

භික්ෂුව ඔබට පැහැදිලි කළා, සම්මා සංකප්පයන් කියන්නේ අවිහිංසා සංකප්ප, අව්‍යාපාද සංකප්ප, නෙක්ඛම්ම සංකප්පයන්ය කියලා. පින්වත් ඔබ සිතන්න, ඔබ ජීවිතකාලය පුරාවටම අවිහිංසාව තුළ, අව්‍යාපාදය තුළ, නෙක්ඛම්මය තුළ ජීවත් වුණොත් ඔබට ලැබෙන ඵලය කුමක් ද? කුසල් සංස්කාරයක්, සුගතියේ උපතක්. එම සුගතියේ උපත නිත්‍යද? අනිත්‍යයද? අනිත්‍යයි. අතීතයේ අවිහිංසාව, අව්‍යාපාදය නිසා මෛත්‍රී ධ්‍යාන සකස්කොට ගත්තත්, එම සංස්කාර අනිත්‍ය වී ගියා. මෙන්න මේ සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකින තැන දී, එම අනිත්‍ය වන සංස්කාරයන්ට නොබැඳෙන තැන දී, ඔබ තුළ ලෝකෝත්තර සම්මා සංකප්පයන් වැඩෙනවා. අතීතයේ සම්මා

සංකප්පයන් වැඩීම නිසා ලැබුණු සංස්කාරයන්ගේ අනිත්‍යභාවය නුවණින් දකිමින් ජීවත් වෙන්න.

## ස්වාමීන් වහන්ස සම්මා දිට්ඨියෙත් සම්මා සංකප්පයන්ගේත් වැඩීම හේතුවෙන් කුමක් ද ශක්තිමත් වෙන්නේ?

සම්මා දිට්ඨිය, සම්මා සංකප්පයන් වැඩීම හේතුවෙන් සීලයට අදාළ සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව කියන අංග තුන ශක්තිමත් වෙනවා. සම්මා වාචා කියන්නේ, යහපත් වචන, නිවැරදි වචන. බොරු කීම, කේලම් කීම, පරුෂ වචන කීම, සම්ප්‍රප්පලාප කීමෙන් බැහැර වීම. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, බොරු කියන පුද්ගලයා මෙලොව, පරලොව දෙකේදීම පිරිහෙනවාය කියලා. බුදුරජාණන් වහන්සේ රාහුල ස්වාමීන් වහන්සේට දේශනා කරනවා, රාහුල බොරු කියන්නා දෙපා සෝදලා ඉවත දමන ජලය වගේය කියලා. දෙපා සෝදලා භාජනයේ ඉතිරිවෙන ජලය ටිකක් වගේය කියලා, වටිනාකමක් නැහැ, පිළිගැනීමක් නැහැ.

සමාජයේ ජීවත්වන සමහරු ගොඩාක් කථා කරනවා, ගොඩාක් අදහස් ප්‍රකාශ කරනවා. නමුත් ඒ කථා අදහස් කවුරුවත්ම පිළිගන්නේ නැහැ. ඇයි එහෙම වෙන්නේ, පෙර ජීවිතයේ බොරු කියලා. බොරු කීමේ විපාකයන් නිසා, ඒ අය කථාකරන වචනවලට කිසිවෙක් ආකර්ෂණය වෙන්නේ නැහැ. කිසිවෙක් එම වචන පිළිගන්නේ නැහැ. බොරුව විපාකදීමේ ශක්තිය වැඩිවෙන්නේ, බොරුවට අරමුණු වෙන්නා වූ පුද්ගලයාගේ තිබෙන නිර්දෝෂීභාවය මත ගුණයන්ගෙන් ඉහළ ස්වාමීන් වහන්සේලා අරමුණු කොට කියන බොරුව, මෙලොව, පරලොව භයානකම අකුසල් විපාක සකස්කොට දෙනවා. බොරුකීමේ විපාකයන් නිසා යමෙක් මනුෂ්‍ය ලෝකයේ ඉපදුනොත්, අඳ, ගොළු, බිහිරි භාවයට පත්වෙන්න, මුහුණ අවලස්සන වෙන්න පුළුවන්. ප්‍රේත ලෝකයට වැටුනොත් කට, දිව කුණුවෙච්ච ප්‍රේතයෙක් වෙන්න පුළුවන්. නිරයට

වැටුනොත් යමපල්ලන් ලෝදිය, ගින්දර කටට වක්කරනවා. බොරු කිව්ව කටම වේදනාවට පත්කරනවා. සාරිපුත්ත මහරහතන් වහන්සේට වරක්, පෘථග්ජන භික්ෂුවක් බොරුවකින් චෝදනා කරනවා. සාරිපුත්ත මහරහතන් වහන්සේ සඟල සිවුරෙන් තමන්ට පහර දුන්නාය කියලා. ඒ වෙලාවේ සාරිපුත්ත මහරහතන් වහන්සේ තම ගුණයන් පිළිබඳව සිංහනාදයක් කරනවා. එම සිංහනාදය බුදුරජාණන් වහන්සේට ඇසුණා, අදාළ බොරුව කිව්ව පෘථග්ජන ස්වාමීන්වහන්සේට කියනවා, සාරිපුත්ත මහරහතන් වහන්සේගෙන් සමාව ගන්න කියලා. ඔබ සමාව නොගත්තොත් ඔබේ හිස සත්කඩකට පුපුරාවි කියලා. ගුණවතුන්ට, සිල්වතුන්ට එරෙහිව කියන බොරුව ඔබේ හිස සත්කඩකට පිපිරීමට තරම් බලයක් වෙනවා. මෙතන දී හිස සත්කඩකට පුපුරනවා කියන්නේ මානසික විකෘතිභාවයන්ට, මානසික ව්‍යාධීන්ට පත්වෙනවා කියන අර්ථයයි. සමාජය තුළ බොරු කීම වැඩිනම්, සමාජය සම්මා වාචාවන්ගෙන් බැහැර වෙනවා නම්, කුසලයට අදාළ වචන පාවිච්චි නොකරනවා නම්, සම්මා වාචාවන්ගෙන් මනුෂ්‍යයා බැහැර වීමට හේතුවයි අපි සොයන්න ඕනේ. සමාජයේ කවුරුන් හෝ බොරු කියනවා නම්, ඔහු තුළ සම්මා වාචා සකස්වෙලා නැහැ. ඇයි සම්මා වාචාවන්ගෙන් දුර්වල වෙන්නේ, සම්මා දිට්ඨියේ දුර්වලභාවය නිසා. සම්මා දිට්ඨිය දුර්වල නම්, ඒ නිසාම බොරු කීම වැඩිවෙනවා නම්, හන්දියක්, හන්දියක් ගානේ බොරු කියන්න එපා කියලා ටියුෂන් පංති පැවැත්වුවත් වැඩක් නැහැ. උසාවියට යවලා දඬුවම් කළා කියලා වැඩක් නැහැ. ජනතාව තුළ සම්මා දිට්ඨියයි ශක්තිමත් කළ යුත්තේ. සම්මා දිට්ඨියේ ශක්තිමත් භාවයෙන් තොරව සමාජයේ බොරු කීම නතර කරන්න බැහැ. ඊට මෙහා ගන්නා සෑම විසඳුමක්ම වක්කඩේ හකුරු හැංගුවා වගේ වෙනවා.

## ස්වාමීන් වහන්ස සම්මා වාචා, ලෝකෝත්තර සම්මා වාචාව බවට පත් කර ගන්නේ කෙසේ ද?

පින්වත් ඔබ කල්පනා කරන්න, ඔබ මොන තරම් මුසාවාදා, පිසුණාවාචා, පරුෂාවාචා, සම්ප්‍රප්ප්‍රලාපවලින් වැළකී ජීවත් වුණත් ඔබ තුළ සකස් වෙන්නේ කුමක් ද? කුසල් සංස්කාරයන්. එම කුසල් සංස්කාරයන් නිත්‍ය ද, අනිත්‍ය ද? අනිත්‍යයි.

සම්මා වාචාවන් තුළින් රැස්වෙන මෙම කුසල් සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකිමින්, එම සංස්කාරයට නොබැඳෙන තැන, විදර්ශනා අංග සහිත ලෝකෝත්තර සම්මා වාචාවන් සකස් වෙනවා. විවේකීව සිටින විට නුවණින් මෙනෙහි කරන්න, අතීත සංසාරය පුරාවට යහපත් වචන, ප්‍රිය වචන කථා කිරීම නිසා එම කුසල් සංස්කාරයන්ගේ ඵලයන් නිසා ප්‍රසන්න රූපයක්, ප්‍රසන්න මුහුණක්, සුවඳ විහිදුවන මුඛයක්, කීර්තිරාවය පැතිරීමක් ලැබුණා නම් ඒ සෑම සංස්කාරයක්ම අනිත්‍යභාවය දකිමින් අනාගත සංස්කාර කෙරෙහි කළකිරීම ඇතිකොට ගන්න. සම්මා වාචාවන් ජීවිතයට එකතුකොටගෙන එම සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකින්න.

## ස්වාමීන් වහන්ස සම්මා කම්මන්ත, සම්මා ආජීව කියන අංග දෙක පහදා දෙන්න.

සම්මා කම්මන්ත කියන්නේ, කයෙන් කුසලයට අදාළව, යහපත් ක්‍රියාවන් සිදු කිරීම. සතුන් මැරීමෙන් වැළකීම, සත්ත්ව හිංසාවෙන් වැළකීම, සොරකම් කිරීමෙන් වැළකීම, මත් වතුර පානයෙන් වැළකීම සහ කාමයේ වරදවා හැසිරීමෙන් වැළකීම. කයෙන් සිදුවෙන්නා වූ අකුසල් විපාකයට පැමිණෙනකොට, කයම පීඩාවට පත්වෙන ලෙඩරෝග, විකෘතීන් ලෙසයි විපාකයන් බොහෝවිට සකස්වෙන්නේ. සත්ත්ව ඝාතනය නිසා මනුෂ්‍යයයා අඩු ආයුෂයෙන් මැරෙනවා, අංගවිකල භාවයන්, නිරතුරුව රෝගාබාධවලින් පෙලෙනවා. සොරකම් කිරීමෙන් වස්තු සම්පත්

හිඟ දුප්පත්භාවයන්ට පත්වෙනවා. ආහාර හිඟකමෙන්, ඇඳුම් පැළඳුම් හිඟකමෙන්, බෙහෙත් ඖෂධ හිඟකමෙන් කයේ සැපයන්ට අදාළව, තමන්ව දුකට පත්කරනවා. කාමයේ වරදවා හැසිරීමෙන් මේ ජීවිතයේ පුරුෂයා ඊළඟ ජීවිතයේදී ස්ත්‍රීත්වයක් ලබනවා, නපුංසකභාවයට පත්වෙනවා, සමාජ රෝග ආශ්‍රිතව කය පීඩාවට පත්කරනවා. පින්වත් ඔබට පුළුවන්නම් තම ජීවිතය තුළින් අධිෂ්ඨානයක් ඇතිකොට ගන්න, මාගේ ශරීරය මා නිරාවරණය කරන්නේ මාගේ නීත්‍යානුකූල ස්වාමිපුරුෂයාට බිරිඳට පමණක්ය කියන අර්ථයට පැමිණෙන්න. එය සම්මා කම්මන්තයන් වැඩිවීමට හොඳ රුකුලක් වෙනවා. එසේ නොවුන තැන අධික කාමාශාවන් නිසා කාමයේ වරදවා හැසිරීමෙන්, ඊළඟ උපත ඌරන්, ඊරියන්, වඳුරන්, වැදිරියන්, රිළවුන්, රිළවියන් වැනි නිරතුරුවම කාමයන් තුළ ජීවත්වන සතුන් ලෙස ඉපදීමේ අනතුර තිබෙනවා. මත් වතුර පානය කිරීම නිසා මෙලොවට බලපතල රෝගාබාධයන්, සමාජ නොපිළිගැනීම්, සම්බන්ධතා බිඳවැටීම් සිදුවෙනවා වගේම මරණින් පසුව මන්දබුද්ධික ජීවිත, මත් වතුර සුවඳ ආශ්‍රිත ස්ථානවල මතට ලැදි ප්‍රේත, ප්‍රේතියන් ලෙස ඉපදීමේ අනතුර තිබෙනවා. සම්මා කම්මන්තයන්ගෙන් බැහැරවෙන තැනදී, පින්වත් ඔබ පත්වෙන අනතුරුදායක ස්වභාවය නුවණින් දකිමින් සම්මා කම්මන්තයන් තුළ ඔබ ශක්තිමත් වෙන්න.

සම්මා ආජීව කියන්නේ, කුසලයට අදාළව යහපත් ව්‍යාපාරයන්හි නියැලීම. මත් වතුර වෙළඳාමෙන් වැළකීම, මස් මාංශ වෙළඳාමෙන් වැළකීම, වසවිස, කෘමිනාශක වෙළඳාමෙන් වැළකීම, අවි ආයුධ, වෙඩි බෙහෙත් වෙළඳාමෙන් වැළකීම, තිරිසන් සතුන්, වහල් වෙළඳාමෙන් වැළකීම, සම්මා ආජීවයන්ට ගැණෙනවා. ඔබට පෙනෙනවා ඇති සමාජය තුළ බොහොම වේගයෙන් සම්මා කම්මන්තෝ සහ සම්මා ආජීවෝ කියන සීලයට අදාළ අංගයන් දුර්වලව යන ආකාරය. මේ කාරණාව දුර්වල වෙලා මනුෂ්‍යයා බලවත් ආකාරයට අකුසලයට යොමුවෙන්නේ සම්මා දිට්ඨියේ

දුර්වලභාවය නිසාමයි. සම්මාදිට්ඨිය දුර්වල වුණ තැන දී, කර්මය, කර්ම ඵල විශ්වාසය දුර්වල වෙනවා. කුසලයට, අකුසලයට අදාළව පටිච්ච සමුප්පන්න නැවත උපත ගැන විශ්වාසය දුර්වල වෙනවා. සතර අපාය කෙරෙහි බිය අඩුවෙනවා. මේ සම්මා දිට්ඨියේ දුර්වලභාවය නිසාම මනුෂ්‍යයා සම්මා කම්මන්තෝ, සම්මා ආජීවෝ මාර්ග අංගයන් දැඩි ආකාරයෙන් දුර්වල කරගන්නවා. සමාජය දෙස බැලීමේ දී මොලයේ දුර්වලතාවයන්, අංගවිකල භාවයන්, මන්ද බුද්ධිකභාවයන්, ශරීරය ආශ්‍රිතව උපතින්ම ඇතිවන මරණීය රෝගාබාධ සහිත දරු උපත්වල වැඩි බවක් පෙනෙනවා. මෙවැනි දරු උපත් නිසා දරුවන් වගේම, දෙමාපියනුත් දැඩි අසරණභාවයන්ට පත් වෙනවා. මෙවැනි දරු උපත්වලට මූලිකම හේතුව සත්ත්ව ඝාතනය, සත්ත්ව හිංසාවන්, මිථ්‍යා ආජීවයට අදාළ මත් වතුර වෙළඳාම වස විස වෙළඳාම, අවිආයුධ වෙළඳාම මූලික වෙනවා. මෙවැනි දුශ්සීල ව්‍යාපාර වැඩිවෙන්න, වැඩිවෙන්න අනාගතයේ දී දරුණු රෝගාබාධ සහිත දරු උපත් සමාජයේ වැඩිවෙනවා. සීලයට අදාළව බුදුරජාණන් වහන්සේ දේශනා කරන සම්මා වාචා, සම්මා කම්මන්තෝ, සම්මා ආජීවෝ කියන අංග තුන, මනුෂ්‍යයා තුළින් දුර්වල වූ නිසාම අනාගත සමාජය තුළ බරපතළ ආකාරයට රෝගාබාධ සහිත පරිසරයක් නිර්මාණය වෙමින් පවතිනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ක්‍රමානුකූලව මනුෂ්‍යාගේ ආයුෂ හීන වෙනවාය කියලා. එය ධර්මතාවයක්. මේ ආයුෂ හීන කිරීමේ ධර්මතාවයට අවශ්‍ය සාධක සපුරලා දෙන්නේ දුශ්සීලභාවය තුළින්මය. සමාජය තුළ සිදුවෙමින් පවතින, ආයුෂ හීනවීම, දරුණු රෝගාබාධ ඇතිවීම, නුවණින් මෙනෙහි කිරීමට දක්ෂ තැනැත්තා, ඊට විසඳුම් සොයන්නේ, සීලයට අදාළව ආර්ය අෂ්ටාංගික මාර්ග යේ ඇති සම්මා වාචා, සම්මා කම්මන්තෝ, සම්මා ආජීවෝ කියන ධර්මයන් ජීවිතයට එකතුකොට ගැනීම තුළින්මය. එහෙත් මේ සීලයට අදාල අංගයන් ඔබ තුළ අර්ථවත්ව වැඩීමට නම් අනිවාර්යයෙන්ම සම්මා සංකප්පයන්ගෙන් සහ සම්මා දිට්ඨියෙන් පරිපූර්ණභාවයට පත්විය යුතුය.

## ස්වාමීන් වහන්ස සම්මා කම්මන්ත සහ සම්මා ආජීව කියන අංගයන් ලෝකෝත්තර සම්මා කම්මන්තයන් බවට, ලෝකෝත්තර සම්මා ආජීවයන් බවට පත් කරගන්නේ කෙසේ ද?

පින්වත් ඔබ කල්පනා කරන්න, ඔබ කොපමණ සම්මා කම්මන්තයන් තුළ සහ සම්මා ආජීවයන් තුළ ජීවත්වුණත් පින්වත් ඔබට ලැබෙන ඵලය කුමක් ද? කුසල් සංස්කාරයන්. එම කුසල් සංස්කාරයන් නිත්‍යයද? අනිත්‍ය ද? අනිත්‍යයි.

පින්වත් ඔබ ඇස් දෙක පියාගෙන අතීත භවයන්හිදී සීලයන් ආරක්ෂාකොට ගැනීම නිසා ලැබුණා වූ දීර්ඝායුෂ, නිරෝගී ජීවිත, නුවණින් දකින්න. පින්වත් ඔබ අතීත සම්මා සම්බුද්ධ ශාසනවල ඉපිද අවුරුදු 30,000, 20,000 ක් පමණ දීර්ඝායුෂ ලැබූ හැටි නුවණින් දකින්න. ඔබ අත්විඳි මේ සංස්කාර නිත්‍ය ද? අනිත්‍යය ද? අනිත්‍යයි.

එහෙම නම් නැවත එම කුසල් සංස්කාරයන්ට ඔබ බැඳෙන්න එපා. සීලය තුළ ශක්තිමත් වෙමින්, නිරතුරුවම සම්මා කම්මන්තයන්, සම්මා ආජීවයන් ජීවිතයට එකතුකොට ගනිමින් කුසලය තුළ ශක්තිමත් වෙමින් එම කුසල් සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකින තැන, පින්වත් ඔබ විදර්ශනා නුවණට අදාළව ලෝකෝත්තර සම්මා කම්මන්ත, සම්මා ආජීව ධර්මයන් ජීවිතයට එකතුකොට ගත්තා වෙනවා. මේ ශක්තියයි ඔබව පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දකින සෝවාන් ඵලය දෙසට ඔබට යොමු කරන්නේ.

## ස්වාමීන් වහන්ස ආර්ය අෂ්ටාංගික මාර්ගයට අදාළ සම්මා වායාම මාර්ග අංගය පහදා දෙන්න.

සම්මා වායාම කියන්නේ, කුසලයට අදාළව කරන යහපත් ව්‍යායාමය. ගිහි පින්වතුන්ලා දිනපතා ව්‍යායාම කරනවා. සමහරු දුවනවා, සමහරු ඇවිදිනවා, අතපය විසිකරනවා. මේක යහපත් ව්‍යායාමයක් ද? කුසල් වැඩෙන ව්‍යායාමයක් ද? රෝගී කයක්

නිරෝගී කරන්නට යාමේ දී මැරෙන කයක්, හැඩ කරන්න යෑමේ දී ඔබ නිරතුරුවම ජාති, ජරා, ව්‍යාධි, මරණ නිසා පීඩාවට පත් වෙනවා. ඒ හේතුවෙන්ම අකුසල් මූලයන් වඩවාගන්නවා. බුදුරජාණන් වහන්සේ පැවිදි අපටත් දිනපතා කරන්න ව්‍යායාමයක් දේශනා කොට තිබෙනවා. ඒ ව්‍යායාමය තමයි උදේම පාත්‍රය අරගෙන ගමට පිණ්ඩපාතය වඩින්න. කිලෝමීටරයක්, දෙකක්, තුනක් දුරවෙන්න පුළුවන්. පිණ්ඩපාතය කරගෙන පෙරළා කුටියට වඩින්න. ලැබුණු පිණ්ඩපාතයෙන් එක වේලෙන් යැපෙන්න. පිණ්ඩපාතය වළඳනකොට ප්‍රත්‍යවේක්ෂාවෙන් වළඳන්න. විවේක වේලාවට සක්මනට ගොඩවෙලා, පියවරට සිත පිහිටුවමින් සක්මන් කරන්න. බලන්නකෝ මොනතරම් අර්ථවත්, ගුණාත්මක, කුසල් වැඩෙන ව්‍යායාමයක් ද කියලා. කය විතරක් නොවේ. සිතත් ධර්මයෙන්, අර්ථයන් ඔස්සේ වැඩෙනවා. රූපයට ඇති තෘෂ්ණාව හීන වෙනවා. ඒ වගේමයි රෝගී කයක්, යම් ප්‍රමාණයකට නිරෝගි වෙනවා. ගිහි පින්වතුන්ලා පැයක් දෙකක් ව්‍යායාම කරලා, තුන් වේලම ආහාර අනුභව කරලා නිදා ගන්නවා. බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ ව්‍යායාම ක්‍රමය ගිහි පින්වත් ඔබත්, ගිහි ජීවිතයට ගැලපෙන ආකාරයට ජීවිතයට එකතුකොට ගතහොත් කය විතරක් නොවේ, ඔබේ කුසල් පක්ෂයත් වැඩෙනවා.

ඉහත ව්‍යයාමයන්ට අමතරව, මෙලොව, පරලොව සැපය සඳහා හේතුවෙන ආර්ය අෂ්ටාංගික මාර්ගයට අයත් සම්මා වායාම කියන උතුම් ව්‍යායාමය දේශනා කරනවා. සම්මා වායාම කියන අර්ථය ඔබ තුළ නිවැරදිව වැඩෙන්න නම්, සම්මා දිට්ඨියෙන් පටන් ගන්නා ආර්ය අෂ්ටාංගික මාර්ගයේ මුල් මාර්ග අංග පහම වැඩෙන්න ඕනේ. සම්මා වායාම කියන අර්ථයට කාරණා හතරක් අයිති වෙනවා.

- **කරන්නා වූ කුසල් තව තවත් ශක්තිමත් කරනවා.**
- **නොකළා වූ කුසල් කරන්න පටන් ගන්නවා.**
- **කළා වූ අකුසල් වලින් බැහැර වෙනවා.**
- **නොකළා වූ අකුසල් කරන්නේ නැහැ.**

ඉහත කාරණා හතර සම්මා වායාම කියන අර්ථයට අයිතිවෙනවා. ඉහත අර්ථය ඔබේ ජීවිතයට එකතුකොට ගැනීම තුළ ඔබේ කුසල් පක්ෂය ශක්තිමත් වෙනවා. ආයුෂ වර්ණය, සැපය, බලය වැඩිවෙනවා. ඒ නිසාම අතීත සංසාරයේ විපාක නොදුන් කුසල් ශක්තීන් ඔබේ ජීවිතයට ගලාගෙන ඒමෙන් ඔබේ ධර්ම මාර්ගය තව තවත් ශක්තිමත් කරනවා. වර්තමාන සමාජය දෙස බැලීමේ දී සමහරක් පින්වතුන්ලා, සම්මා දිට්ඨියේ අර්ථකථනයන්ගෙන් පරිපූර්ණ නොවී, සම්මා වායාමයන් ජීවිතයට එකතුකොට ගැනීමෙන් පින ගින්දරක් බවට පත්කොටගන්නා ආකාරයක් පෙනෙන්නට තිබෙනවා.

## ස්වාමීන් වහන්ස සම්මා වායාම කියන අර්ථය ලෝකෝත්තර සම්මා වායාමයක් බවට පත්කොට ගන්නේ කෙසේ ද?

පින්වත් ඔබ නුවණින් දකින්න. ඔබ කොච්චර කුසල් දහම් වඩමින්, අකුසල් ධර්මයන්ගෙන් බැහැරව ජීවත් වුණත්, ඔබට ලැබෙන්නේ කුමක් ද? කුසල් සංස්කාරයක්. ඒ හේතුවෙන් සුගතියේ උපතක්. එම කුසල් සංස්කාරය, සුගතියේ උපත නිත්‍යද? අනිත්‍යය ද? අනිත්‍යයි.

අතීත සම්මා සම්බුද්ධ ශාසනවල ඉපදිලා අපි මොනතරම් කුසල් දහම් වඩන්න ඇතිද? අකුසල් ධර්මයන්ගෙන් ඈත්ව ජීවත්වෙන්න ඇත්ද. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ඔබත්, මමත්, සංසාරයේ උතුම් පැවිදි උපසම්පදාවන් ලබලා, අවුරුදු ලක්ෂ ගණන් කුසල් දහම් වඩලා තිබෙනවා කියලා. නමුත් මේ සෑම සංස්කාරයක්ම අනිත්‍යභාවයට පත්වුණා. සම්මා වායාම අර්ථය තුළින් සකස්වෙන කුසල් සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකිමින් ඇති කරගන්නා විදර්ශනාත්මක දැක්ම ඔබට ලෝකෝත්තර සම්මා වායාම කියන අර්ථය ඔබ තුළ ඇතිකර ගන්නවා. එවිට ඔබ අනිත්‍යවන සංස්කාරයන්ට බැඳෙන්නේ නැහැ. සම්මා වායාමයන් ජීවිතය තුළින් ශක්තිමත් කොට ගෙන එම කුසල් සංස්කාරයන්ගේ

අනිත්‍යභාවය දකිමින් පංචඋපාදානස්කන්ධයේ අනිත්‍ය දැක්ම ශක්තිමත් කොට ගන්නවා.

## ස්වාමීන් වහන්ස සම්මා සතිය කියන්නේ කුමක් ද?

ආර්ය අෂ්ටාංගික මාර්ගයේ, මුල් මාර්ග අංග හය වැඩීම නිසා සකස්වෙන ඵලය සම්මා සතියයි. සම්මා සතිය යනු, අකුසලය, අකුසලය වශයෙන් හඳුනාගෙන අකුසලයෙන් බැහැර වෙනවා. කුසලය, කුසලය වශයෙන් හඳුනාගෙන කුසලය තුළ ශක්තිමත් වෙනවා. ලෞකික සම්මා සතිය තුළ ජීවත්වන පින්වතා, අනිත්‍ය දෙය අනිත්‍ය වශයෙන් දකින්න දක්ෂ නැහැ. නමුත් අනිත්‍ය දෙය තුළිනුත් කුසලයක් මතුකොටගන්න ඔහු දක්ෂයි. දුක් දෙය, අසුභ දෙය, අනාත්ම දෙය, විදර්ශනා නුවණින් දකින්න දක්ෂ නැහැ. නමුත් ඒවා තුළිනුත්, කුසල් සංස්කාරයන් මතුකොටගන්න ඔහු දක්ෂයි. ඒ සංස්කාර උපයෝගි කරගෙන ඔහු භවයේ නැවත සුගතිගාමී උපතක් ප්‍රාර්ථනා කරනවා. ලෞකික සම්මා සතිය තුළ තෘෂ්ණාව බැසගෙන තිබෙනවා. ඒ නිසාම ඔහු දස කුසල් කරමින් නැවත භවයේ, සුගතියේ උපතක් බලාපොරොත්තු වෙනවා. පංචඋපාදානස්කන්ධයේ අනිත්‍ය භාවයට අදාළ ධර්මයන් ඔහු තුළින් වැඩෙන්නේ නැහැ. මම කියන දෘෂ්ඨිය සැපවත් කිරීමටයි, සුගතියට ඔසවා තැබීමටයි සම්මා සතිය උපකාරි වෙන්නේ. සම්මා සතිය සකස් කරගත් පින්වතා ආර්ය අෂ්ටාංගික මාර්ගයේ මුල් මාර්ග අංග හය හොඳින් අඳුරනවා. අශ්‍රද්ධාවෙන්, ශ්‍රද්ධාව වෙන් කරගෙන, මිච්ඡා සංකප්පයන්ගෙන්, සම්මා සංකප්පයන් වෙන් කරගෙන, දුශ්සීලභාවයෙන් සිල්වත්භාවය වෙන් කරගෙන, සුගතියට අදාළව ධර්ම මාර්ගය ශක්තිමත් කොට ගන්නවා. නමුත් ඔහුගේ ධර්ම මාර්ගය තුළ භව තෘෂ්ණාව සැඟවී තිබෙනවා.

## ස්වාමීන් වහන්ස ලෝකෝත්තර සම්මා සතිය යනු කුමක් ද?

ලෞකික සම්මා සතිය, විදර්ශනා නුවණින් දක්ක තැන ලෝකෝත්තර සම්මා සතිය සකස් වෙනවා. ලෝකෝත්තර සම්මා සතිය තුළ තෘෂ්ණාව බැසගෙන නැහැ. ඔහු අනිත්‍ය දෙය, අනිත්‍ය වශයෙන් දකිනවා. දුක දෙය, දුක වශයෙන් දකිනවා, අනාත්ම දෙය, අනාත්ම වශයෙන් දකිනවා, අසුභ දෙය අසුභ වශයෙන් දකිනවා. ශ්‍රද්ධාවත්, සීලයත්, කුසලයත්, සංස්කාරයන් බව ඔහු හඳුනනවා. එම සංස්කාර සුගතියේ විපාකයන් සකස්කොට දී අනිත්‍යවන බව නුවණින් දකිනවා. ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩීම තුළ සකස්වෙන කුසල් සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකිමින් පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දැකීමට අවශ්‍ය විදර්ශනා නුවණින් ඔහු ශක්තිමත් වෙනවා. සැපයට ඇති කැමැත්තත්, දුකට ඇති අකැමැත්තත් ඔහු තමා තුළ සකස්වෙන පංචඋපාදානස්කන්ධයක් බව දකිනවා. පංචඋපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය දකිමින් සැපත්, දුකත් දෙකෙන්ම මිදීමේ මාර්ග යට ඔහු අවතීර්ණ වෙනවා. කුසල්, අකුසල් සංස්කාරයන්ට ඔහු බැඳෙන්නේ නැහැ. සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකිමින් සම්මා වීර්යය, සති, සමාධි, ප්‍රඥා ධර්මතාවයන් එකිනෙකට සමකොට ගන්නවා. මෙය ලෝකෝත්තර සම්මා සතියේ ලක්ෂණයයි.

## ස්වාමීන් වහන්ස සම්මා සමාධිය ගැන විස්තර කොට දෙන්න.

සම්මා සමාධිය කියන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ මුල් මාර්ග අංග හතේ ඵලයයි. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ, මුල් මාර්ග අංග හත හොඳින් වැඩීම, නිසා සකස්වෙන පංචනීවරණයන් වූ, කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච-කුක්කුච්ච, විචිකිච්ඡා කියන ධර්මයන් යටපත් වූ ධ්‍යානගත සිතට සම්මා සමාධිය කියලා කියනවා. ධ්‍යානගත සමාධිමත් සිත තුළ තෘෂ්ණාව බැසගෙන තිබෙනවා. බුදුරජාණන් වහන්සේගේ ධ්‍යානගත සමාධියට දේශනා කරන්නේ, වේදනාවේ

ආශ්වාදය කියලා. ආශ්වාදය තිබෙන තැන, අනිවාර්යයෙන්ම ආදීනවයක් තිබෙනවා. ආශ්වාදය සැපය සකස්කොට දෙන අතර, ආදීනවය දුක සකස්කොට දෙනවා. සමාධිය තුළ ඔබ, මම තුළ සමාධිය තිබෙනවාය කියලා දකිනවා. සමාධිය තුළ ආත්මයක් ඒ ආත්මය තුළ සමාධිය තිබෙනවාය කියලා දකිනවා. ඒ නිසාම සමාධිය නිසා සකස්වෙන ආශ්වාදයන්ට නිරතුරුවම බැඳීයනවා. ඒ හේතුව නිසාම ධ්‍යාන උපාදානය කොටගෙන රූපාවචර, අරූපාවචර බ්‍රහ්මතලවල, සතර අපායෙන් නොමිදීම උපත ලබනවා. ඒ හේතුව නිසාම නැවත නැවතත් භවයේ දුකට වැටෙනවා. අකුසල් බැහැර වූ තැන, කුසලය තුළ ශක්තිමත් වූ තැන, ඇතිවන ඉන්ද්‍රිය සංවරය ලෞකික සම්මා සමාධියට අඩිතාලම වෙනවා. ඒ හේතුවෙන්ම සකස්කොට ගන්නා ධ්‍යානගත සිත සම්මා සමාධියේ ඵලය වෙනවා.

## ස්වාමීන් වහන්ස ලෝකෝත්තර සම්මා සමාධිය යනු කුමක් ද?

ලෞකික සම්මා සමාධිය, විදර්ශනා නුවණින් දකින තැන ලෝකෝත්තර සම්මා සමාධිය සකස් වෙනවා. ලෝකෝත්තර සම්මා සමාධිය තුළ තෘෂ්ණාව බැසගෙන නැහැ. සමාධියේ ආශ්වාදයත්, ආදීනවයත් හොඳින් හඳුනන ඔහු වේදනාවේ නිස්සරණයට මාර්ගය සොයා ගන්නා කෙනෙක් වෙනවා. ඔහු නුවණින් මෙනෙහි කරනවා, අතීත සංසාරයේ සමාධිය ප්‍රගුණ කරලා, රූපාවචර, අරූපාවචර බ්‍රහ්මතල වල කල්ප ගණන් ගතකරලා, නැවත සතර අපායන්ට වැටුණු හැටි. රූපාවචර, අරූපාවචර ධ්‍යාන සකස්කරගෙන අතීතයේ ඍද්ධියෙන් ගමන් කළ හැටි, ලෝකෝත්තර සම්මා සමාධිය සකස්කොට ගත් තැනැත්තා දක්ෂයි, මේ සියලු සමාධියේ සංස්කාරයන් අනිත්‍යයි කියලා දකින්න. ඒ නිසාම ඔහු මේ මොහොතේ සකස්වෙන ධ්‍යානගත සිතට බැඳෙන්නේ නැහැ. ඒ ධ්‍යානගත සිතේ අනිත්‍යභාවය දකිමින් තමයි, ධ්‍යාන සුවය ලබන්නේ. ඔහු දක්ෂයි අශ්වාස, ප්‍රාශ්වාසයේ දිග භාවය අනිත්‍ය

වෙලයි, ආශ්වාස ප්‍රශ්වාසයේ කෙටි භාවය සකස් වුණේ, ආශ්වාස ප්‍රශ්වාසයේ කෙටි භාවය අනිත්‍ය වෙලයි විචාර විතර්කයක් සංහිඳුනේ. විචාර විතක්කයක් අනිත්‍යභාවයට පත්වෙලයි ප්‍රීතිය, සැපය ඇති වුණේ. ප්‍රීතිය, සැපය අනිත්‍යභාවයට පත්වෙලයි උපේක්ෂාව කියන තැනට සිත පත්වුණේ කියලා. විදර්ශනා නුවණින් සමාධියේ යථා ස්වභාවය, වෙනස්වන ස්වභාවය දකිමින් සමාධිය කෙරෙහි ඇති තෘෂ්ණාවෙන් මිදී නිස්සරණය මතුකොට ගන්න දක්ෂයි. ලෝකෝත්තර සම්මා සමාධිය සකස්කරගත් පින්වතා, සමාධිය යනු ධ්‍යානගත සිතක් යනු, රූපය ඇසුරින් සකස්වෙන පංචඋපාදානස්කන්ධයක් බවත්, සමාධිය නිත්‍යභාවයෙන් ගැනීම යනු පංචඋපාදානස්කන්ධය නිත්‍යභාවයෙන් ගැනීමත් බවත් දකිනවා. ඒ නිසාම සමාධිය කෙරෙහි ඇති තෘෂ්ණාවෙන් මිදෙමින්, පංචඋපාදානස්කන්ධය කෙරෙහි ඇති තෘෂ්ණාවෙන් බැහැරවීම, ලෝකෝත්තර සම්මා සමාධිය වෙනවා. මේ ලෝකෝත්තර සම්මා සමාධියේ ඵලය වශයෙනුයි ඔබ තුළ සම්මා ඥාන සකස් වී සම්මා විමුක්තිය සාක්ෂාත්කොට දෙන්නේ.

ඉහත කාරණාවන් තුළින් පින්වත් ඔබට හොඳින් වැටහෙනවා ඇති, ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගයත්, ලෝකෝත්තර ආර්ය අෂ්ටාංගික මාර්ගයත් අතර ඇති වෙනස බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ ලෝක ධාතුවේ සැප ලබාදෙන එකම මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගය කියලා. පින්වත් ඔබ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කරන ප්‍රමාණයට, ඔබ තුළින් අකුසලය දුරුවී, සැපයට අදාළව කුසලය ශක්තිමත් වෙනවා. ඒ හේතුව නිසාම පින්වත් ඔබ මෙලොව, පරලොව සැපය, සුගතිය අයිතිකොට ගන්නවා. මේ අර්ථය අයිතිවෙන්නේ ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගයට. කුසලය, සුගතිය, භවය අරමුණුකොට ගමන් ගන්නා මාර්ගය ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගය වෙනවා. මුලින්ම පින්වත් ඔබ ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ශක්තිමත් වෙමින්, කුසල් පක්ෂය ශක්තිමත් කොටගනිමින්, කළ්‍යාණමිත්‍ර ආශ්‍රය, සද්ධර්ම

ශ්‍රවණය, නුවණින් මෙනෙහි කරමින් ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගයට අදාළව කුසලය, සුගතිය, භවය, අනිත්‍යබව දකිමින් එම සංස්කාරයන්ට නොබැඳී, නොඇලී, විදර්ශනා නුවණ මෝදුකොටගෙන සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අරහත්භාවයන් සාක්ෂාත් කොට දෙන අර්ථයට ලෝකෝත්තර ආර්ය අෂ්ටාංගික මාර්ගය යැයි හඳුන්වනවා. පින්වත් ඔබ මෙතෙක් උතුම් සෝවාන් ඵලයට පත්වී නැතිනම් ඔබ තවමත් ගමන් කරමින් සිටින්නේ ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගයේ බව ඔබ දකින්න දක්ෂ වෙන්න ඕනේ. පින්වත් ඔබ විවේකීව සිටින සෑම මොහොතකම ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අර්ථයන් නුවණින් දකිමින් එම කුසලයට, සුගතියට, භවයට අදාළ එම අර්ථයන්ගේ අනිත්‍යභාවය දකිමින් ලෝකෝත්තර ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළට අවතීර්ණ වෙන්න උත්සාහ ගන්න. ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අර්ථයන් අනිත්‍ය වශයෙන් දකින මොහොතක් පාසා, ඔබ තුල වැඩෙන්නේ පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය බව ඔබ හොඳින් වටහා ගන්න. ආර්ය අෂ්ටාංගික මාර්ගය ගැන සටහන අවසන් කරන මොහොතේ භික්ෂුවට පින්වත් පුංචි දරුවෙක් කියපු අර්ථවත් කතාවක් මතක් වුණා. මේ දරුවා පළමුවැනි වසරේ ඉගෙනුම ලබන දරුවෙක්. රාත්‍රියේ නිදාගන්න සූදානම් වෙනකොට, අම්මා දරුවාට කියලා තිබෙනවා, පුතේ අපි ටිකක් භාවනා කරමුද කියල. අම්මයි, පුතයි දෙන්නා ඇඳේ දෙපැත්තේ එරමිණියා ගොතාගෙන භාවනා කරලා නියමිත වේලාව අවසාන කළාට පස්සේ අම්මා දරුවාගෙන් අහලා තිබෙනවා පුතේ භාවනාකරන කොට, ඔයාට මොනවාද මතකයට ආවේ කියලා. දරුවා කිව්වලු තාත්තාව මතකයට ආවා, කියලා. එහෙම කියලා, ඒ දරුවා කියනවලු අම්මේ රූපය මාරයා නේද, කියලා. පුංචි දරුවාගේ මේ දැක්ම අවබෝධාත්මක දැක්මක් නොවුවත්, අවබෝධය සඳහා හොඳ අර්ථවත් ප්‍රවේශයක් වෙනවා. තම දරුවගේ හපන්කමක් පිළිබඳව තාත්තා කෙනෙක් කළ ප්‍රකාශයකුයි භික්ෂුව ඉහතින් සඳහන් කළේ. රූපයත්, සංස්කාරයත්,

සුගතියත්, මාරයා වශයෙන් දකින අවබෝධාත්මක අර්ථය ලෝකෝත්තර ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සැබෑම අර්ථය වෙනවා.

මහත්මයෙක් භික්ෂුවගෙන් ප්‍රශ්නයක් විමසුවා, ස්වාමීන් වහන්ස, අපි වගකීම් යුතුකම් සමග බොහෝම අවිවේකී ජීවිතයක් ගත කරන්නේ, මෙහෙම අවිවේකී ජීවිතයක් තුළින් ධර්මය මතුකොට ගන්න අපහසුයි නේද කියලා. පින්වත් ඔබලා ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ඒ කියන්නේ ධර්ම මාර්ගයේ ඉහත සඳහන් කළ කාරණාවන් ජීවිතයට එකතු කොට ගැනීමට, ජීවිතයේ වගකීම්වලට, කාර්යබහුලභාවය බාධාවක් බවට පත්වෙන්නේ නැහැ. ජීවිතයේ වගකීම් වැඩි වෙන්න, වැඩි වෙන්න ආර්ය අශ්ටාංගික මාර්ගය වැඩීම ඔබට පහසු වෙනවා. පින්වත් ඔබ මුලින්ම සම්මා දිට්ඨියේ අර්ථයන් ජීවිතය තුළින් පෝෂණය කර ගැනීමට තමයි වෙහෙසක්, කැපවීමක් සිදු කළ යුත්තේ, සම්මා දිට්ඨිය පරිපූර්ණ කරගන්න තැනදී, ඔබේ ජීවිතයේ අවිවේකී භාවය ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩීමට හොඳ තෝතැන්නක් වෙනවා.

පින්වත් ඔබ නුවණින් මෙනෙහි කොට බලන්නකෝ වගකීම් වැඩි කෙනෙකුට ද, වගකීම් අඩු කෙනෙකුට ද වැඩියෙන් සම්මා සංකප්පය වඩන්න පුළුවන් කියලා. හිංසාවෙන්, ව්‍යාපාදයෙන් පිරුණු සමාජය ඔබට අවිහිංසාව, අව්‍යාපාදය වැඩීමට හොඳ අත්වැලක් සපයා දෙනවා. පින්වත් ඔබ සිතන්න, ඔබ ඉදිරියට දිනකට එක පින්වතෙක් පැමිණියොත් ද, ඔබ ඉදිරියට පින්වතුන් සියයක් පැමිණියොත් ද, ඔබට වැඩිපුර සම්මා සංකප්පයෙන්, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා වායාම ධර්මයන් වැඩිපුර ජීවිතයෙන් වඩන්න පුළුවන් කියලා. ඔබ ඉදිරියට දිනකට සිය දෙනෙක් පැමිණියොත්, ඔබට ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩවා ගැනීමේ ශක්තිය වැඩි වෙනවා.

ගිහි පින්වතුන් වශයෙන් ඔබේ ජීවිතය ඉදිරියට ඔබ අකැමති දේවල් නිතරම සිදුවෙනවා නම්, ඔබ දක්ෂවෙන්න ඕනේ, ඔබ අකැමති දේවල් නිරතුරුව සිද්ධවෙන්නේ අකුසල් සංස්කාරයන්

නිසා. එම අකුසල් සංස්කාරයන් විපාක දෙනවිට ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ශක්තිමත් වෙමින් කුසලය මතුකොට ගන්න. භික්ෂුවගේ ගිහි ජීවිතයේ දී ගතකළේ අවිවේකී ජීවිතයක්. මෙතනදී මම කැමති කරන අත්දැකීම්වලට වඩා මට ලැබුණේ අකැමති කරන අත්දැකීම්. නමුත් එදා මම ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අර්ථයන් දැනගෙන සිටියේ නැති වුණත්, නිරතුරුව මා තුළ වැඩී ඇත්තේ ආර්ය අෂ්ටාංගික මාර්ගයම බව දැන් මට හොඳින් වැටහෙනවා. සද්ධර්ම ශ්‍රවණය තුළින්, සම්මා දිට්ඨියේ අර්ථය ජීවිතයට එකතුවෙන තැන දී, ආයාසයකින් තොරවම ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩීමේ අත්දැකීම මට ගිහි ජීවිතයේ දී ලැබී තිබුණා. පින්වත් ඔබ අහිංසක, අසරණ, දුගී පින්වතෙකුට සිනහවකින් සතුටු කරන තැන දී, පින්වත් ඔබ වාඩි වී සිටින ආසනය තවත් කෙනෙකුට පරිත්‍යාග කරන තැන දී, අසරණ පින්වතෙක් බත් කටක්, රුපියලක් පරිත්‍යාග කරන තැන දී ඔබ එය සිදුකරන්නේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් නම් කර්මය, කර්මඵල විශ්වාසය ඇතුව නම්, ඔබ තුළ වැඩෙන්නේ සම්මා දිට්ඨියේ අර්ථයන්මය. දුක තුනීකොට ගැනීමට තෘෂ්ණාව සියුම් කොට ගැනීමට ධර්ම මාර්ග යේ ගමන් කිරීමට උත්සාහ ගන්න පින්වතා මුලින් කළ යුතු වන්නේ සම්මා දිට්ඨියේ අර්ථයන් නුවණින් මෙනෙහි කිරීමේ භාවනාවයි. භික්ෂුවගේ ජීවිතයේ භික්ෂුව මුලින්ම කළ භාවනාව කුමක් ද කියලා මේ මොහොතේ සිහිපත් කරන කොට භික්ෂුව මුලින් පුහුණුකොට තිබෙන්නේ සම්මා දිට්ඨියේ අර්ථයන් නුවණින් මෙනෙහි කිරීමේ භාවනාවයි. මෙය භික්ෂුව ආරම්භ කළේ, ගිහි ජීවිතයේදී. සම්මා දිට්ඨි භාවනාව මා තුළින් අර්ථවත් වෙද්දී අවිවේකී, කටුක, පෙරළා හොඳක් නොලැබෙන, සමාජයට කිඳා බසිමින් මා රැස්කොට ගත්තේ, සම්මා සංකප්පයක්මයි. කුමක් ද මෙතනදී සිදුවෙලා තිබෙන්නේ. සම්මා දිට්ඨිය සහ සම්මා සංකප්පයන් යනු ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ප්‍රඥාවට අදාළ අංග දෙකයි. ප්‍රඥාවට අදාළ අංග දෙක

මූලික කොට, මා තුළින් වැඩීමේ දී එම ප්‍රඥාවට අදාළ අංග දෙකේ අර්ථයන් තුළින්ම මා සීලයෙනුත්, සමාධියෙනුත් පරිපූර්ණභාවයට පත්වීමයි. අවසානයේ දී සිදුවී තිබෙන්නේ. ධර්ම මාර්ගයේ දී බාහිර උවදුරුවලට කොටු නොවී ශක්තිමත් ස්ථාවරයක් ගොඩනගා ගන්න. ඉහත උපක්‍රමය භික්ෂුවට හොඳ ආරක්ෂාවක් ලබා දුන්නා. ගිහි ජීවිතයේ දී මම සීලය මුල්තැනට ගත්තා නම්, කාමයන්ගේ නිෂ්ඵලභාවය, අවබෝධකොට ගැනීමට අත්දැකීම් නොමැතිභාවය නිසාම, පංචනීවරණයන්ට යටවී, සමාධියත්, ප්‍රඥාවත් දෙකම අහිමි කොට ගන්නවා. ගිහි ජීවිතයේදී අවශ්‍ය තැන දී ආශ්වාදය ලබමින් බිඳුණු සිල්පදයත්, ඉන් සකස්වුණු අකුසල් සංස්කාරයනුත් අනිත්‍ය බව දකිමින් අකුසලයක් තුළින්ම කාමයන්ට අභියෝග කොට අනිත්‍යවන අකුසල් සංස්කාරයක් තුළින් සමාධියත්, ප්‍රඥාවත් දෙකම මෝදු කොට ගැනීමට මට එදා දක්ෂභාවය තිබුණ. මෙය සම්මතයන්ට අභියෝග කොට මාර්ගය මතුකොට ගන්න අවස්ථාවක් හැටියටයි මම දකින්නේ. ඒ හැකියාව මට ගිහි ජීවිතයේ දී ලැබුණේ මගේ කුසල් සංස්කාරයන්ගේ බලවත්භාවය නිසාමයි කියලයි මා දකින්නේ. වක්කලී ස්වාමීන්වහන්සේ බෙල්ල කපාගෙන උතුම් රහත්ඵලයට පත්වී පිරිනිවී ගියාය කියලා තව කෙනෙක් බෙල්ල කපාගෙන උතුම් රහත්ඵලය අවබෝධ කොටගන්න උත්සාහ කළ යුතු නැහැ. චක්ඛුපාල මහරහතන් වහන්සේ ඇස් දෙකට ප්‍රතිකාර නොකර දෑස් අන්ධභාවයට පත්වී උතුම් රහත්ඵලයට පත් වුණාය කියලා තව කෙනෙක් දෑස් අන්ධ කොට ගෙන උතුම් රහත්ඵලයට පත්වෙන්න උත්සාහ කළ යුතු නැහැ. ඒවා එකිනෙකාගේ අතීත සංස්කාර ධර්මයන්ට අදාළව සිදුවෙන ධර්මතාවයන්. නමුත් කෙනෙකුගේ අත්දැකීම් ප්‍රකාශ කිරීමේ අයිතිය කාටත් තිබෙනවා. නමුත් ඒවා තව කවුරුවත් ආදර්ශයට ගත යුතු නැහැ. එම අත්දැකීම් ප්‍රකාශ කිරීම නිසා ගිහි පින්වතුන්ලා ගැටීමට පත්විය යුතුත් නැහැ. අහිංසක කුමාරයා මනුෂ්‍ය ඝාතන 999 ක් සිදුකරලා, අංගුලිමාල හැටියට උතුම් අරහත්ඵලය සාක්ෂාත් කොටගත් උතුම් සම්මා

සම්බුද්ධ ශාසනයක් තුළයි අපි මේ අත්දැකීම් සටහන් තබන්නේ. ආර්ය අෂ්ටාංගික මාර්ගයට අදාළව මේ සටහන් අවසන් කරන කොට භික්ෂුව ඔබට බොහෝම කාරුණිකව මතක් කරනවා දිනපතා සම්මා දිට්ඨියේ අර්ථයන් භාවනාවක් හැටියට නුවණින් මෙනෙහි කරන්න. සම්මා දිට්ඨි භාවනාව තුළ ගෙවාගෙන පැමිණි අතිදීර්ඝ භව ගමනත්, අනාගත භව ගමනේ දීර්ඝ කටුක භාවයත්, කුසලයේ සැපයත්, අකුසලයේ දුකත්, ශ්‍රද්ධාවේ සම්මා දිට්ඨියත්, අශ්‍රද්ධාවේ මිථ්‍යාදෘෂ්ටියත්, භව ගමනත්, භව නිරෝධයත් පිළිබඳව සැබෑම චිත්‍රය පින්වත් ඔබට මතුකොට දෙනවා. ලෞකික සම්මා දිට්ඨිය කුසලය පිළිබඳවත් භවයේ සැපය, දේවතානුස්සතිය පිළිබඳවත්, ලෝකෝත්තර සම්මා දිට්ඨියේ අර්ථයන් තුළ, සංස්කාරයන්ගේ අනිත්‍ය දැක්ම තුළ ප්‍රඥාව මෝදු වීමත් සිදුවෙනවා. මෙම සටහනේ මුලින් සඳහන් සම්මා දිට්ඨියේ අර්ථයන් කමටහනක් කොට ගත් තැන දී මුලු ආර්ය අෂ්ටාංගික මාර්ගයේම අර්ථය ඔබේ ජීවිතයට එකතුකොට ගැනීමේ ශක්තිය ලැබෙනවා.

## ස්වාමීන් වහන්ස පාසල් දරුවෙක් ආර්ය අෂ්ටාංගික මාර්ගය කුමන ආකාරයකට ද ජීවිතයට එකතුකොට ගත යුත්තේ?

සංකිච්ච පොඩිහාමුදුරුවෝ, දබ්බමල්ලපුත්ත පොඩිහාමුදුරුවෝ, නිග්‍රෝධ සාමණේර හාමුදුරුවෝ, චුල්ලපන්ථක පොඩිහාමුදුරුවෝ ළමා වයසේදීම උතුම් රහත්ඵලයට පත්වෙනවා. එසේනම් වර්තමානයේ පාසල් දරුවන්ට ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩන්න බැහැය කියලා කියන්න බැහැ. ප්‍රශ්නය තිබෙන්නේ දරුවන්ගේ දෙමාපියන්, සමාජය, දරුවාට කල්‍යාණමිත්‍රයෙක් වෙනවා ද කියන කාරණයයි. දෙමාපියන් තුළින්, ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩීම දුර්වලවෙනකොට දරුවන් දෙමාපියන්ගේ ආදර්ශයයි ජීවිතයට එකතුකොට ගන්නේ. ඒනිසා මුලින්ම දෙමාපියන්, ගුරුවරුන්, දරුවාට ආදර්ශයක් විය යුතු වෙනවා. දෙමාපියන් ආර්ය අෂ්ටාංගික

මාර්ගය තුළ ශක්තිමත් වෙමින්, තම දරුවන්ට, පාසල් අධ්‍යාපනයට අදාළව දුක කියන කාරණය දරුවාට කියලා දෙන්න. මෙතනදී දුක කියලා කියන්නේ මොකද්ද? දුප්පත්භාවය, අල්පේශාක්‍යභාවය ගැන පින්වත් ඔබ දරුවාට කියලා දෙන්න. පුතේ බලන්න, සමාජයේ මනුෂ්‍යයෝ දුක්විඳින හැටි. මහා අවිකාශ්ටකයේ රැකියාවක් කරමින්, ජීවිතය පරදුවට තබා රැකියාව කරමින්, හැමෝටම මහත්මයා, නෝනා කියමින් රැකියාවක් කරමින්, තමන්ට නොගැලපෙන රැකියාවක් කරමින්, විරැකියාවෙන් ජීවත් වෙමින්, දෙමාපියන්ට බරක් වී ජීවත් වෙමින්, රටට බරක් වෙමින් ජීවත් වෙමින්, මේ හැමෝම දුකක් විඳින්නේ. කෙනෙක් ඉහළ වෘත්තියක් දරනකොට තවත් කෙනෙක් කම්කරු රැකියාවක් කරන්නේ, හේතුඵල ධර්මයන් නිසා. මෙතනදී කම්කරු රැකියාව කරන පින්වතාට අගෞරවයක් කරනවා නොවේ. සැප විඳින වෘත්තීන්ට සාපේක්ෂව ඔහු විඳින්නේ දුකක්. ඒක අපි පිළිගන්න ඕනේ. දැන් පින්වත් දරුවන්ට සමාජය දෙස බැලීමේ දී දුක කියන කාරණය පෙනෙනවා නේද? කෙටියෙන්ම කියනවා නම්, අඩු ආදායම්ලාභී සහ ඒ හේතුවෙන්ම අඩු සැපයක් ලැබීම, සමාජයේ මතුපිටින් පෙනෙන දුක වෙනවා. දැන් දරුවන් හිතන්න මේ දුකට හේතුව කුමක් ද කියලා. මොකද්ද මේ දුකට හේතුව. දෙමාපියන්ට අකීකරු වීම, ගුරුවරුන්ට අකීකරු වීම, අධ්‍යාපනයට මුල් තැන නොදීම, අධ්‍යාපනය ලැබිය යුතු කාලයේදී බාහිර දේවල්වලට සිත යොමු කිරීම. දැන් පාසල් දරුවන්ට පෙනෙනවා දුක කුමක් ද, දුකට හේතුව කුමක් ද කියලා. එසේ නම් සමාජයේ මනුෂ්‍යයා ලබන අඩු ආදායම්, අවම සැපයන් කියන දුක නැති කිරීමට නම් දරුවන් කුමක් ද කළ යුත්තේ. දුක ඇතිවීමට හේතුව සොයාගෙන එය නැති කිරීමයි. එහෙම නම් දෙමාපියන්ට, ගුරුවරුන්ට අකීකරු වීම, අධ්‍යාපනයට මුල් තැනක් නොදීම, අධ්‍යාපනය ලැබිය යුතු කාලයේ දී බාහිර දේවල්වලට සිත යොමු කිරීම වැනි දුකට හේතුවන පුරුදුවලින් දරුවන් ඉවත් විය යුතුයි. පින්වත් දරුවන් දුක කියන කාරණය දැකලා, දුකට හේතුව

අධ්‍යාපනය දුර්වලවීමට අදාළ දේවල්වලට ඇති තෘෂ්ණාව බවත් දැකලා එම වැරදි පුරුදුවලින් මිදිය යුතුයි. එම වැරදි පුරුදුවලින් මිදීමේ මාර්ගය තමයි, ආර්ය අෂ්ටාංගික මාර්ගය. දරුවෙකුට පුළුවන් තමන් තුළ සකස්වෙන, මම දෙමාපියන්ට, ගුරුවරුන්ට කීකරුවෙනවා කියන එක චින්තයකින්, තමා තුළ මුලු ආර්ය අෂ්ටාංගික මාර්ගයම වඩවා ගන්න. මම බාහිර දේවල් කෙරෙහි තෘෂ්ණාවෙන් තොරව අධ්‍යාපනය තුළ ශක්තිමත් වෙනවාය, කියන චිත්තය ඇති කරගන්නා මොහොතේම, එම දරුවා තුළ මුලු ආර්ය අෂ්ටාංගික මාර්ගයම වැඩෙනවා. මම කේන්තිගන්නේ නැහැ. ගෙදර සහෝදර සහෝදරියන් සමග පන්තියේ ළමයින් සමග කේන්තිගන්නේ නැහැ, රණ්ඩු වෙන්නේ නැහැය කියලා ඇති කරගන්න එක චින්තයක් තුළ එම දරුවා ආර්ය අෂ්ටාංගික මාර්ගයම වැඩුවා වෙනවා. අම්මා, තාත්තාට කීකරු වෙනවා කියලා සිතනකොටම දරුවා තුළ තෙරුවන් කෙරෙහි ගරු කිරීමක් ඇති වෙනවා. අම්මා, තාත්තාගේ ගුණයන් හඳුනාගෙන, ඒ දෙමාපියන්ට කීකරු වීම, සම්මා දිට්ඨියට අදාළ ධර්මතාවයක්. එහෙම සිතන දරුවා තුළ, දෙමාපියන් කෙරෙහි හිංසාකාරී සිතිවිල්ලක්, ද්වේෂයක් ඇති වෙන්නේ නැහැ. අකුසලයට අදාළ ක්‍රියාවන් අතහරිනවා. ඒ කියන්නේ සම්මා සංකප්පයන් වැඩෙනවා. තම දෙමාපියන්ට, ගුරුවරුන්ට කීකරු වෙනවාය කියලා සිතක් සකස් වෙනකොට එම දරුවා සිල්පද රකින කෙනෙක් වෙනවා. ඒ කියන්නේ සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව ධර්මයන් වැඩෙනවා. දෙමාපියන්ට, ගුරුවරුන්ට කීකරු සිතක් සකස්කොටගත් මොහොතේදීම ඇති අකුසල් තුනී වෙලා, අලුතින් කුසල් වැඩෙනවා. ඒ කියන්නේ සම්මා වායාමෝ ධර්මයන් වැඩෙනවා. දෙමාපියන්ට, ගුරුවරුන්ට කීකරුවෙනවාය කියන චිත්තය ඇතිවෙන මොහොතේම එම දරුවා තුළ, කුසලයේ, අකුසලයේ වෙනස හඳුනාගෙන දුකට සහ සැපයට හේතූන් හඳුනාගෙන අකුසලයෙන් මිදී කුසලය හඳුනාගන්නා කෙනෙක් බවට පත් වෙනවා. ඒ කියන්නේ සම්මා සතිය

ඇතිවෙනවා. දැන් ඒ පින්වත් දරුවාට විසිරුණු සිතක් නැහැ. පාඩම් කරන වෙලාවට කාටූන් මතක් වෙන්නේ නැහැ. සෙල්ලමට සිත දුවන්නේ නැහැ. අධ්‍යාපනය කියන අරමුණ කෙරෙහි, අධ්‍යාපනයේ වටිනාකම කියන අරමුණ කෙරෙහි දෙමාපියන්ගේ, ගුරුවරුන්ගේ සිත රිදවන්නේ නැහැය කියන අරමුණ කෙරෙහි, එම පින්වත් දරුවාගේ සිත තැන්පත් වෙනවා. එය එම දරුවාගේ සම්මා සමාධිය වෙනවා. පින්වත් දරුවෙක් තුළ ඇති කොටගන්නා එක යහපත් චිත්තයක් තුළ දෙමාපියන්ට, ගුරුවරුන්ට කීකරු වෙනවා කියන චිත්තය තුළ, එම නිමේෂයේ දී මුළු ආර්ය අෂ්ටාංගික මාර්ගයම වැඩෙනවා. ඒ කියන්නේ පාසල් දරුවා දන්දෙන්නේ නැහැය කියලා, පින්කම් නොකළාය කියලා, භාවනා නොකළාය කියලා ඔහුට ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගයේ රැකවරණය අහිමි නැහැ. එම නිසා පින්වත් දෙමාපියන්, ගුරුවරුන් දක්ෂ වෙන්න, ආදර්ශයෙන්, උපක්‍රමශීලීව, පාසල් දරුවා තුළින් ආර්ය අෂ්ටාංගික මාර්ගය ශක්තිමත් කොට දෙන්න. පින්වත් දරුවෙක් අම්මාට පසඟ පිහිටුවා වන්දනා කරනවා. වන්දනා කරලා දරුවා අම්මාට කියනවා, අම්මේ මට ආර්ය අෂ්ටාංගික මාර්ගය ගැන කියලා දෙන්නකෝ කියලා. එවිට අම්මා දරුවාට කියනවා, පුතේ ඒවා ඉගෙන ගන්නේ ලොකු අය. ඔයා තවම පොඩියි කියලා, මොකද අම්මාට තේරෙන්නේ නැහැ තම දරුවා තමන්ට පසඟ පිහිටුවලා වන්දනා කරන්න ඇතිකොටගත් චිත්තය තුළ දී, මුලු ආර්ය අෂ්ටාංගික මාර්ගයේම අර්ථයන් දරුවා තුළින් වැඩුනාය කියලා. අදක්ෂ අම්මා නිසා, දක්ෂභාවය සැඟවී තිබූ දරුවාගේ දක්ෂභාවය මතු වෙන්නේ නැහැ. එම නිසා පින්වත් දෙමාපියන්, ගුරුවරුන් දක්ෂ වෙන්න පාසල් දරුවෙක් සිදු කරන සෑම හොඳ ක්‍රියාවක් තුළින්ම එම දරුවාට ආර්ය අෂ්ටාංගික මාර්ගය මතුකොට දක්වන්න. ගෙදර දොරේ කටයුතු වලදී දරුවා දෙමාපියන්ට උපකාරයක් කරන කොට, ආච්චිට, සීයාට ආදරයෙන් කතාකරන කොට, තිරිසන් සතෙකුට මෛත්‍රියක් දක්වනකොට, අන්‍යයන්

සමග සමගියෙන් ජීවත්වෙනකොට, දෙමාපියන්ගේ, ගුරුවරුන්ගේ සිත් සතුටු කරනකොට, වැඩිහිටියන්ට වන්දනා කරන කොට එම දරුවාට කියලා දෙන්න, පුතේ මේ පුංචි ක්‍රියාවේදී ඔයා මුළු ආර්ය අෂ්ටාංගික මාර්ගයම වඩවාගත්තාය කියලා. දරුවාට ඒ මොහොතේ ඔබ දක්වූ ධර්මාවබෝධය නිසා පින්වත් ඔබ තුළින් ඒ මොහොතේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අර්ථයන් පරිපූර්ණව වැඩුණා වෙනවා. වර්තමානයේ දෙමාපියන්ට, ගුරුවරුන්ට වඩා සමහරක් පින්වත් දරුවන් ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ගමන් කරනවා. නමුත් ඒ බව දරුවන් දකින්නේ නැහැ. දෙමාපියන්, ගුරුවරුන් දන්නෙත් නැහැ. දරුවෙක් යහපතෙහි යෙදුනොත් එම දරුවා පසසනවා, නායකත්වය පවරනවා වගේම, එම යහපත තුළ සැඟවී ඇති ධර්මයේ ශ්‍රේෂ්ඨ මාර්ගය දරුවාට පැහැදිලි කොට දීමට පින්වත් වැඩිහිටියන් දක්ෂ නම්, වැඩිහිටියනුත්, දරුවාත් මතුකොටගන්නා කුසල් චිත්තය තම තමන්ගේ අතීත අකුසල් යටපත් කොට, කුසල් පක්ෂය මතුකොට අධ්‍යාපන ක්ෂේත්‍රයේ, තව තවත් ශක්තිමත්ව ඉදිරියට යෑමට එම පින්වත් දරුවාට හැකියාව ලැබෙනවා වගේම දරුවා තුළින් ආර්ය අෂ්ටාංගික මාර්ගය තව තවත් ශක්තිමත් කොට ගැනීමටත් හේතු වෙනවා. එසේ නොවී යහපත් දරුවා තුළින් ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩෙද්දී ඒ බව වැඩිහිටියනුත්, දරුවාත් නොදන්නේ නම්, කුසල් චේතනාවේ දූර්වලභාවය නිසාම ශක්තිමත් කුසලයක් දරුවන් නිරතුරුවම අහිමි කොට ගන්නවා. දරුවන් තුළින් නිරතුරුවම ආර්ය අෂ්ටාංගික මාර්ගයට අදාළව යහපත් ක්‍රියාවන්, තම ජීවිතයට සැප ලැබෙන ක්‍රියාවන් සිද්ධ වෙනවා. ඒ බවක් එම දරුවන් හඳුනාගන්නේ නැහැ. ඒ නිසාම ඊට අදාළ චේතනාව සකස්වෙන්නේ නැහැ. අවාසනාව කියන්නේ, දරුවා තුළින් යහපත් ක්‍රියාවන් සිදුවුනත්, ශක්තිමත් චේතනාවක් ඇතිකොට ගැනීමට ඇති දූර්වලතාවය නිසා නිරතුරුවම ශක්තිමත් කුසලයක් අහිමිකොට ගනිමින් තමයි සමාජයේ දරුවන් ළමා කාලය ගෙවා දමන්නේ. දරුවෙක් තුළ සකස්වෙන එක යහපත් සිතුවිල්ලක

සැඟවී ඇති උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගයේම අර්ථයෙන් පින්වත් වැඩිහිටි පක්ෂයත් දරුවාත් දැනුවත් වීම, ඔබ ඔබේ අනාගතයට කර ගන්නා හොඳම ආයෝජනයක් වෙනවා. ඒ වගේමයි, දරුවෙක් මම, අම්මා, තාත්තාට කීකරු වෙන්නේ නැහැය කියලා, අම්මා, තාත්තාට දුකක් දෙන හැම මොහොතේම එම දරුවා තුළ මිච්ඡා ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අර්ථයයි වැඩෙන්නේ. ඒ කියන්නේ එම දරුවා අනාගත, දුකකට අදාළ සංස්කාරයන් රැස්කොට ගන්නවා. දරුවා තුළ සකස්වෙන හැම යහපත්, අයහපත් සිතුවිල්ලක්ම ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ විසුරුවා දරුවාට දැක්වුවොත්, එය වැඩිහිටියන් දරුවන්ට දෙන ශ්‍රේෂ්ඨම ධර්මයේ දායාදය වෙනවා. පින්වත් ඔබ, ඔබේ දරුවාගෙන් අනාගතයේ යහපතක් බලාපොරොත්තු වෙනවා නම්, ලෞකික සැපය, ලෝකෝත්තර සැපය ලැබෙන එකම මාර්ගය වෙන ආර්ය අෂ්ටාංගික මාර්ගය ගැනම දරුවන් සමග කතා කරන්න. දරුවාට තේරුම් කොට දෙන්න.

**සබ්බ දානං ධම්ම දානං ජිනාති**
**සියලු දානයන් අතර ධර්ම දානයම අග්‍රවන්නේය.**

# පුණ්‍යානුමෝදනාව

- මෙම ධර්ම දානමය කුසල් බෙලෙන් අප සැමට උතුම් දහම් මග පෙන්වා දෙන සිල්වත් වූ, ගුණවත් වූ, උත්තම පුණ්‍ය ක්ෂේත්‍රයක් බදු වූ, ඉතා දුර්ලභව අප ලද බුද්ධ පුත්‍රයන් වහන්සේ වන අති පූජ්‍ය රාජගිරියේ අරියඥාණ ස්වාමීන් වහන්සේ ඇතුළුව උතුම් සදහම් මඟ අප සැමට විවර කරදෙනු ලබන සියලුම මහා සංඝරත්නයටත්, නිදුක් නිරෝගී චිර ජීවනය ලැබේවා ! අප සැමට තව තවත් සදහම් මග විවිර කිරීමට අවශ්‍ය ශක්තිය, ධෛර්යය සහ නිරෝගි සුවය ලැබේවා !

- මහේෂාක්‍ය, අල්පේෂාක්‍ය, දිව්‍යරාජ සමූහය ද මේ උතුම් ධර්ම දානමය පින අනුමෝදන්ව සම්මා සම්බුද්ධ ශාසනය චිරාත් කාලයක් රැකදේවා!

- මෙම උතුම් ධර්ම දානය ලබන ඔබ සියලු දෙනාටත්, ධර්ම ග්‍රන්ථය ඉදිරිපත් කළ, සකස් කළ සියලු දෙනාටත්,

- මෙම උතුම් ධර්මදානය සඳහා දායක වූ සියළු දෙනාටත්, ලංකාව පුරා බෙදාහැරීමට දායක වන සියළු ආයතන හිමි මහත්ම මහත්මීන්ටත් පුද්ගලිකවම එම උතුම් කාර්යයයේ නියැලෙන සියළු දෙනාටත්,

මෙම ඝෝර කටුක භයානක සංසාරයේ බිය දැක මේ ආත්ම භවයේදීම සසර දුකින් එතෙර වීමට මෙම ධර්ම දානමය කුසල කර්මය හේතු වේවා! පාරමිතාවක්ම වේවා !



“ මේ උතුම් ආර්ය
අෂ්ටාංගික මාර්ගය,
පින්වත් ඔබ නිවැරදිව
ජීවිතයට එකතු
කරන්නේ නම්, සෑම
නිමේෂයකදීම, නිවනට
පක්ෂ වෙන්නා වූ
සත්තිස් බෝධිපාක්ෂික
ධර්මයන් සියල්ලම ඔබ
තුලින් ලියලා වැඩෙනු
ඇත. ”

ISBN 978-955-7887-07-4

9 789557 887074

මුද්‍රණය: ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්

ධර්ම දානය පිණිස නොමිලේ බෙදා හැරීම සඳහාය